ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් බයෝ ටෙක්නොලොජී
Sri Lanka Institute of Biotechnology
ஸ்ரீ லங்கா இன்ஸ்டிடியுட் ஓப் பயோடெக்னொலஜி

2021

වාර්ෂික වාර්තාව
Annual Report
ஆண்டு அறிக்கக

Copyright ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් බයෝටෙක්නොලොජි ප්‍රයිවට් ලිමිටඩ්
2022

මෙම කාර්යය ප්‍රකාශන හිමිකමට යටත් වේ. පරිවර්තන, නැවත මුද්‍රණය, නිදර්ශන නැවත භාවිතය, පාරායනය, විකාශනය, ප්‍රතිනිෂ්පාදනය හෝ ක්ෂුද්‍ර චිත්‍රපටය හෝ වෙනත් ආකාරයකින්, සහ දත්ත බැංකුවල ගබඩා කිරීමේ අයිතිය සම්බන්ධයෙන්, සම්පූර්ණ හෝ ද්‍රව්‍යයේ කොටසක් අදාළ වුවද, සියලු හිමිකම් ඇවිරිණි. මෙම ප්‍රකාශනය හෝ එහි කොටස් අනුපිටපත් කිරීම 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත මත පදනම්ව ශ්‍රී ලංකාවේ ප්‍රකාශන හිමිකම් නීතියේ විධිවිධාන යටතේ පමණක් අවසර දී ඇති අතර භාවිතය සඳහා අවසරය සැමවිටම ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් බයෝටෙක්නොලොජි ප්‍රයිවට් ලිමිටඩ් වෙතින් ලබා ගත යුතුය.

උල්ලංඝනය කිරීම් ශ්‍රී ලංකාවේ ප්‍රකාශන හිමිකම් නීතිය යටතේ නඩු පැවරීමට යටත් වේ.

ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් බයෝටෙක්නොලොජි ප්‍රයිවට් ලිමිටඩ්
(SLIBTEC)
අදියර I ගොඩනැගිල්ල
මාහේන්වත්ත, තලගල පාර, පිටිපන
හෝමාගම
10206
ශ්‍රී ලංකාව
https://slibtec.gov.lk/
info@slibtec.gov.lk/slibtec@gmail.com
+94 11 343 1844

අන්තර්ගතය

පූර්විකාව 04
සභාපතිතුමාගේ ප්‍රකාශය 05
ප්‍රධාන මෙහෙයුම් නිලධාරිනියගේ සමාලෝචනය 06
අපගේ ක්‍රමෝපාය 08
අපි කවුද 13
අපගේ කාර්යභාරය 17
SLIBTEC පර්යේෂණ 17
SLIBTEC උද්‍යානය 17
පාරිසරික තිරසාරභාවය 22
ගෝලීය සබඳතා 25
මූල්‍ය සාරාංශය 28

ජෛව තාක්‍ෂණ ක්ෂේත්‍රය තුල ඉහල නැංවෙන SLIBTEC කාර්ය සාධනය

13.2 අක්කර

උද්‍යානය

48,865 වර්ග අඩි

පර්යේෂණ

පාරිසරික නිෂ්කාශනය

පර්යේෂණ සහ නවෝත්පාදන, සේවා සහ ගිවිසුම් පර්යේෂණ සඳහා රසායනාගාර පිහිටුවීම

පූර්විකාව

ආර්ථිකය හා සමාජය තුළ සුවිශේෂී විප්ලවයන් සිදු කිරීමේ ශක්තියක් නව ජෛවතාක්ෂණ හැකියාවන් සතුව ඇත. එහි බලපෑම් අගය දාම ඔස්සේ පර්යේෂණ හා නවෝත්පාදන සිදුකරන ආකාරයේ සිට නිෂ්පාදනවල භෞතික යෙදවුම් දක්වාත්, ඖෂධ හා පරිභෝගික නිෂ්පාදන බෙදාහැරීම හා පරිභෝජනය වන ආකාරය දක්වාත් බලපෑම් කරනු ඇත.

මානව සෞඛ්‍යය යනු ජෛවතාක්ෂණයේ ප්‍රගමනයන් භාවිතාවට ගනු ලබන අතිශය වැදගත් අංශවලින් එකකි. ජෛවතාක්ෂණය දැනටමත් අපගේ ජීනෝම හා ක්ෂුද්‍රබයෝමවලට ගැළපෙන නව්‍ය ප්‍රතිකර්ම මගින් ජීවිත බේරා ගැනීමට සහාය වෙමින් පවතී. වර්තමානයේදී සොයා ගනු ලබන විද්‍යාත්මක ජෛවතාක්ෂණික යෙදවුම් මගින්, අනාගතයේදී රෝග පිළිබඳ ගෝලීය ගැටළු අඩකට ආසන්න ප්‍රමාණයක් විසඳිය හැකිවනු ඇති බවට තක්සේරු කර ඇත.

දශක ගණනාවක් මුළුල්ලේ සිදුවෙමින් පවතින ජෛවතාක්ෂණික සංවර්ධනය විසින්, පරිඝණකකරණය, ස්වයංක්‍රියකරණය හා කෘතිම බුද්ධියේ (AI) ශීඝ්‍ර දියුණුවෙන් ද සහාය ලැබ, සෞඛ්‍යයය හා කෘෂිකර්මාන්තයෙහි සිට පාරිභෝගික භාණ්ඩ හා බලශක්තිය දක්වා ආර්ථිකය හා සමාජය කෙරෙහි සුවිශේෂී බලපෑමක් ඇති කරවීමට හැකි නවෝත්පාදන රැල්ලක් බලගන්වා ඇත. දැනටමත්, මෙම නව හැකියාවන් හා යෙදවුම් දේශගුණික විපර්යාසවල සිට වසංගත තත්ත්ව දක්වා වූ ගෝලීය අභියෝග කෙරෙහි අපගේ ප්‍රතිචාර වැඩිදියුණු කර ඇත ; ආසන්නතම අවස්ථාව වන්නේ COVID-19 ගෝලීය වසංගත තත්ත්වයට පිළියම් ලෙස ජෛවතාක්ෂණය පාදක කරගත් නිෂ්පාදන රැසක් හඳුන්වාදීමයි.

මේ සම්බන්ධයෙන් සැලකූ විට, ශ්‍රී ලංකාව යනු ඉහළ ජෛව විවිධත්වයක් හා දක්ෂ මානව සම්පත් සංචිතයක් ද සහිත, එතරම් ගවේෂණයට ලක්නොවුණු කලාපයකි. වාණිජමය යෙදවුම් සඳහා වන මෙම ඉහළ විභවතාවය හා අවකාශය සමග, තිරසාර ලෙස ජෛවතාක්ෂණ කර්මාන්ත ස්ථාපනය කිරීම සඳහා වැඩි වශයෙන් රාජ්‍ය අනුග්‍රහය අවශ්‍ය වේ. ජෛවතාක්ෂණික නවෝත්පාදන ඔස්සේ ආර්ථික සංවර්ධනයට දායක වීමෙහි ලා ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශය දක්වනු ලබන දායකත්වය පිළිබඳ සෑහීමකට පත්විය නොහැකි ය. එබැවින්, ජෛවතාක්ෂණ කර්මාන්තයන් සඳහා ආයෝජන ප්‍රවර්ධනය කිරීමේ ප්‍රතිපත්ති අනුගමනය කිරීම (ස්ථාපනය කිරීමේ රෙගුලාසි ලිහිල් කිරීම, ජෛවතාක්ෂණ කර්මාන්ත සඳහා බදු සහන ලබාදීම ආදී) සහ ජෛව ඖෂධ හා රෝග නිර්ණය සඳහා කඩිනම් අනුමතකරණ ක්‍රියාවලියක් ඇතිකිරීම සඳහා පවතින නියාමන ආකෘතිය වෙනස්කිරීම ද ශ්‍රී ලංකාවට අතිශය වැදගත් වනු ඇත.

ප්‍රධාන ලෙසම, ජයග්‍රාහී සොයාගැනීම් හා නවෝත්පාදන වෙත මඟ පෑදිය හැකි පර්යෙෂණ හා සංවර්ධන ආකෘතියක් ස්ථාපනය කිරීම උදෙසා ද, රාජ්‍ය හා පෞද්ගලික විශ්ව විද්‍යාලවලින් උපාධි ලැබූ අපගේ ඉහළ පුහුණුවක් සහිත මානව සම්පත් සංචිතයෙන් උපරිමය උකහා ගැනීමට අවස්ථාව සමඟින් ශ්‍රී ලංකාව වෙත ආදායම් ගෙන එමින් ගෝලීය වෙළඳපළට පිවිසීමේ ඉලක්කය ඇතිව ද, තාක්ෂණ අමාත්‍යාංශය යටතේ සංස්ථාගත, පූර්ණ වශයෙන් රජයට අයත් විවිධ ක්ෂේත්‍රවල සිදු කළ හැකි පර්යෙෂණ හා සංවර්ධන ආයතනයක් ලෙස, ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් බයෝටෙක්නොලොජි (SLIBTEC) ස්ථාපනය කරන ලදී. අපනයන වැඩි කිරීම ද සමඟින්, ඉහළ මට්ටමේ ජෛව තාක්‍ෂණ නිෂ්පාදන සංවර්ධන පරිසර පද්ධතියක් ස්ථාපිත කිරීමේ ප්‍රධාන අරමුණ ඇතිව, ජාතික හා ගෝලීය වශයෙන් වැදගත් අංශ සඳහා ජෛව තාක්‍ෂණ ආශ්‍රිත කාලීන හා ඉදිරි විසඳුම් සැපයීම පිණිස විවිධ ක්ෂේත්‍රවල ආයෝජනය කිරීමට SLIBTEC ආයතනය අවධානය යොමු කරනු ලැබේ.

SLIBTEC ආයතනය සංරචක දෙකකින් සමන්විත වේ; අති නවීන බහුවිධ පර්යේෂණ පහසුකමක් වන SLIBTEC පර්යේෂණ සහ, නියාමන සහාය සඳහා එක් ස්ථානයක් තුළ උසස් ගණයේ ජෛව තාක්‍ෂණ නිමැවුම් නිෂ්පාදන පහසුකම් සැලසීම පිණිස වන SLIBTEC උද්‍යානයයි. ආයතනය තුළ පවතින අද්විතීය පහසුකම් සමඟින්, ජාන ඉංජිනේරු විද්‍යාව සහ ජෛව තාක්‍ෂණය පිළිබඳ ජාත්‍යන්තර මධ්‍යස්ථානය (ICGEB) සඳහා කලාපීය පර්යේෂණ මධ්‍යස්ථානයක් ලෙස SLIBTEC ආයතනය සිය ධාරිතාව පුළුල් කරනු ඇත. නවෝත්පාදනය, සංවර්ධනය සහ නිෂ්පාදනය ඒකාබද්ධ කිරීම සහ අති නවීන තාක්‍ෂණයන් අඛණ්ඩව අනුගත කර ගැනීම තුළින්, ජෛව තාක්‍ෂණය පදනම් කරගත් නිෂ්පාදන සහ නවක ව්‍යාපාර මෙහෙයුම් සඳහා අත්‍යවශ්‍ය පහසුකම් සමඟ අදාළ සියලුම අංශ නඟා සිටුවමින්, ශ්‍රී ලංකාව තුළ නවීන නවෝත්පාදක පරිසර පද්ධතියක් ගොඩනැඟීමට SLIBTEC ආයතනයට හැකි වනු ඇත.

සභාපතිතුමාගේ පණිවිඩය

ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් බයෝටෙක්නොලොජී පුද්ගලික සමාගමෙහි 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මූල්‍ය වර්ෂය සඳහා වන සවිස්තරාත්මක වාර්ෂික කාර්ය සාධන වාර්තාව කළමණාකරණ මණ්ඩලය වෙනුවෙන් ඉදිරිපත් කිරීමට ලැබීම සතුටට කාරණයකි.

COVID-19 වසංගතයෙන් යථා තත්ත්වයට පත්වීමත් සමඟ, 2021වසර තවත් අසාමාන්‍ය ගෝලීය කැළඹීම් සහිත වසරක් වූ බව සමාජයේ බහුතර මතය යැයි මා විශ්වාස කරමි. මෙම කාල සීමාවේ දී අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් සහ කාර්ය මණ්ඩල සාමාජිකයින් බොහෝ දෙනෙකුගේ පෞද්ගලික හෝ රාජකාරී ජීවිත කෙරෙහි අහිතකර බලපෑම් ඇතිවිය. මෙම කාලය පුරාවටම අපගේ SLIBTEC කණ්ඩායම, එනම් අපගේ ප්‍රධාන මෙහෙයුම් නිලධාරිනී අමාලි රණසිංහ මහත්මිය ප්‍රමුඛ ඇයගේ කණ්ඩායම, SLIBTEC ආයතනය සංවර්ධනය කිරීමට අඛණ්ඩව අවධානය යොමු කර ඇත. නිරන්තර දුෂ්කර තත්වයන් මධ්‍යයේ වුවද SLIBTEC කණ්ඩායමෙන් දිස් වූ උද්‍යෝගය ආදර්ශමත් වන අතර ඒ ගැන මම අතිශයින් ආඩම්බර වෙමි.

කර්මාන්තමය හා කෘෂිකාර්මික අවශ්‍යතාවන් සඳහා භාවිතා කළ හැකි, ආර්ථික වශයෙන් මෙන්ම තාක්ෂණික වශයෙන් ඉහළම ශක්‍යතාවකින් යුත් තාක්‍ෂණයක් ලෙස ජෛවතාක්‍ෂණය සැලකේ. පර්යේෂණවල ප්‍රතිඵලයන් වෛද්‍ය, කර්මාන්ත, කෘෂිකර්මාන්ත හා පාරිසරික අංශවලට අදාළව නිෂ්පාදන සහ සේවා බවට පත්කිරීමේ අභිප්‍රාය ඇතිව ජෛව තාක්‍ෂණ අංශයේ පර්යේෂණ සහ නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීමට සහ රැකවරණ පහසුකම් (ඉන්කියුබේටර්) සලසමින් නවක ව්‍යාපාර සංස්කෘතියකට ආධාර වීමට SLIBTEC අරමුණු කරනු ලැබේ

SLIBTEC සීමාසහිත පුද්ගලික සමාගමෙහි කොටසක් බවට පත්ව ශ්‍රී ලංකාව ලෝක සිතියමෙහි දිදුළවීම සහ නව තාක්‍ෂණයන් වාණිජකරණය වේගවත් කරමින් ද, නැගී එන ව්‍යාපාර පෝෂණය කරමින් හා නඩත්තු කරමින් ද, දේශීය හා ජාත්‍යන්තර අධ්‍යාපන ක්ෂේත්‍රය වැනි අනෙකුත් ජෛව තාක්‍ෂණ පාර්ශවකරුවන් සමඟ සම්බන්ධතා ගොඩනහා ගැනීමට නව ව්‍යවසායයන් වෙත සහය වෙමින් ද, ප්‍රමුඛතම ජෛව තාක්‍ෂණ පර්යේෂණ සහ නවෝත්පාදන ව්‍යවසායයක් බවට එය වර්ධනය වනු දැකීමෙන්, මම සතුටට පත්වෙමි.

උසස් විශේෂඥතාවයක් ලත් වෘත්තිකයන් සහ අනෙකුත් විශේෂඥයින්ගෙන් සමන්විත අපගේ කණ්ඩායම, නවෝත්පාදනයේ ප්‍රතිඵලයක් ලෙස ලද සෑම ජයග්‍රහණයක් ගැනම සහ ජෛව තාක්‍ෂණ ව්‍යාපෘති කිහිපයක් එකවර හැසිරවීමේ හැකියාවක් සමඟින් ලබා දෙන වටිනාකම පිළිබඳ පෞද්ගලිකවම ආඩම්බර වන්නෙමි.

අප අපගේ අරමුණු ළඟා කර ගැනීම කෙරෙහි අවධානයෙන් හා ඒ වෙනුවෙන් කැපවී සිටිමු.

අනුරාධ කුමාරසිරි
සභාපති

ප්‍රධාන මෙහෙයුම් නිලධාරිනියගේ පණිවිඩය

අනෙකුත් කර්මාන්ත අංශ මෙන් නොව, COVID-19 වසංගතයේ මෙම අතිශය අභියෝගාත්මක තත්ත්වයේදී, මානව වර්ගයාගේ යහපැවැත්ම සඳහා ජෛව තාක්‍ෂණ කර්මාන්ත ලබා දෙන අප්‍රමාණ හැකියාවන් සහ දායකත්වය හේතුවෙන් ආයෝජකයින්ගේ විශ්වාසය සුරක්ෂිත කිරීමට සහ ශක්තිමත් කිරීමට ක්ෂේත්‍රය සමත් වී තිබේ. ජෛව තාක්‍ෂණය ආශ්‍රිත විද්‍යාවන්හි විප්ලවීය රැල්ලක් පවතින බවටත්, එහි ප්‍රතිඵලයක් ලෙස නව ප්‍රතිකාර ක්‍රම සඳහා විවෘත වීමේ හැකියාවක් පවතින බවටත් දැනටමත් පුළුල්ව ව්‍යාප්තව පවතින මතය මෙමගින් තහවුරු විය. පුද්ගලික ආයෝජන සහ නවෝත්පාදන මගින්, SLIBTEC ආයතනය තුළ ඵලදායිතා වැඩිදියුණු කිරීම, අන්තර්ගත හා තිරසාර ආර්ථික වර්ධනය සහ රැකියා උත්පාදනය සඳහා විශාල දායකත්වයක් ලබාදෙන අතර ශ්‍රී ලංකාව තුළ නවෝත්පාදන දිරිමත් කිරීම හා තිරසාර ආර්ථික වර්ධනයක් ඇති කිරීමටත් හැකියාව ලැබේ.

SLIBTEC හි මූලික පරමාර්ථය වන්නේ කර්මාන්ත හිතකාමී හා වැඩිදියුණු කළ නියාමන වාතාවරණයක් සඳහා අභ්‍යන්තරව සහාය වෙමින්, ජෛව තාක්‍ෂණ පර්යේෂණ, නවෝත්පාදන සහ නිෂ්පාදන සඳහා ඔවුන්ගේ පහසුකම් ස්ථාපිත කිරීමට බාහිර පාර්ශ්වකරුවන්ට අවස්ථාව ලබා දීමයි. සෞඛ්‍ය සේවා, ආහාර හා කෘෂිකර්මාන්තය, පරිසරය සහ කර්මාන්ත සඳහා තාක්ෂණයේ වැදගත්කම සහතික කරමින්, ජාතික හා ගෝලීය පරිසරය තුළ පර්යේෂණ හැකියාවන් සහ තාක්ෂණ නවෝත්පාදනයන් පුළුල් කිරීම කෙරෙහි ද එය මග විවර කරනු ලබයි.

ජෛව තාක්‍ෂණය සඳහා ආයෝජනය පසුගිය වසර 2-3 තුළ ගෝලීය වශයෙන් ශක්තිමත් වී ඇත. ජෛව ඖෂධ කර්මාන්තයේ බොහෝ සමාගම් කොරෝනා වයිරසය සඳහා ප්‍රතිකාර සහ එන්නත් නිපදවීම වෙනුවෙන් සැලකිය යුතු ලෙස ආයෝජනය කිරීමට පටන් ගත් බැවින් මෙම අංශය තුළ උත්තේජනයක් ඇති විය. වෛද්‍ය ක්ෂේත්‍රය තුළ ඇතැම් නැගී එන හා වැදගත් ජෛව තාක්‍ෂණ අංශ අතරට ප්‍රතිදේහ ඖෂධ සංයෝජන නිපදවීම, ප්‍රදාහක රෝග සඳහා ප්‍රතිකාර කිරීම සඳහා ජෛව චිකිත්සාව, ජාන සංස්කරණ තාක්ෂණයේ CRISPR මත පදනම් වූ ප්‍රතිකාර සහ ස්වයං ප්‍රතිශක්තිකරණ රෝග සහ පිළිකා සඳහා නව ප්‍රතිකාර සංවර්ධනය කිරීම ඇතුළත් වේ.

තවද, ජාන සංස්කරණය, සිඝ්‍ර බෝග වැඩිදියුණු කිරීම සඳහා අණුක මට්ටමේ අභිජනනය, පෝෂණ භෝග වැඩිදියුණු කිරීම පිණිස හා සුනිශ්චිත කෘෂිකර්මාන්තය දියුණු කිරීම සඳහා මෙවලම් භාවිතය පිණිස කෘෂිජෛව තාක්‍ෂණික යෙදුම් යොදා ගැනීම ශීඝ්‍රයෙන් සිදුවෙමින් පවතී.

ජෛව තාක්‍ෂණ කර්මාන්තය සතු හැකියාවන් අතිමහත් වන අතර, කාර්මික හා විද්‍යාත්මක ක්ෂේත්‍රයේ භාවිතා කරන එන්සයිම, ආහාර හා සත්ව ආහාර ස්වභාවිකව පරිරක්ෂණය කිරීම සඳහා ශාක මූලික ප්‍රති-ක්ෂුද්‍රජීවී ද්‍රව්‍ය යොදා ගැනීම, විකල්ප ප්‍රෝටීන සඳහා සුනිශ්චිත පැසවීම, ක්ෂුද්‍රජීවීන් මගින් රසායනික නිස්සාරණය වෙනුවට හරිත කැණීම, රූපලාවණ්‍ය ද්‍රව්‍ය සඳහා ජෛව ක්‍රියාකාරී අමුද්‍රව්‍ය සහ ජෛව ක්‍රියාකාරී ස්වභාවික නිෂ්පාදන ආදිය විශේෂයෙන් දැක්විය හැකි සමහරකි.

SLIBTEC හෝමාගම පිටිපන ප්‍රදේශයේ ජෛව තාක්ෂණ නවෝත්පාදන පරිසර පද්ධතියක් ගොඩනැගීමේ ක්‍රියාවලියක නිරතව සිටී. SLIBTEC උද්‍යානය වෙත ආයෝජකයින් ආකර්ශනය කර ගනිමින් ශ්‍රී ලංකාවේ ජෛව තාක්ෂණ නවෝත්පාදනයේ උන්නතිය උදෙසා අඛණ්ඩව ක්‍රියාත්මක වේ. නවෝත්පාදන ජෛව තාක්‍ෂණ අංශය පුරා ශක්තිමත්ව නැගී සිටින අතර අංශයේ කාර්ය සාධනය සඳහා වන ප්‍රධාන සාධකය ලෙස අඛණ්ඩව ක්‍රියාත්මක වනු ඇත. SLIBTEC ආයතනයෙහි අප පර්යේෂණ කණ්ඩායමේ ශක්තිය නිසාවෙන් කලාපය තුළ ආකර්ශනීය ආයෝජන ලබා ගැනීමේ දී අපට තරඟකාරී වාසියක් ඇති බව අපගේ නොසැළෙන විශ්වාසයයි.

ජෛව තාක්ෂණ ආයෝජන විශ්වීය මට්ටමෙන් පුළුල් වී ඇති හෙයින්, හිතකර හා ක්‍රමික වෙනස්වීම් සහිත වෙළඳපල පරිසරයක් තුළ ජෛව තාක්ෂණ අංශයේ සාර්ථක ලෙස ආයෝජනය කිරීම සඳහා විද්‍යාත්මක විශේෂඥතාව ඉතා වැදගත් බව විශ්වාස කරමින්, SLIBTEC ආයතනය විසින් විෂය විශේෂඥයින් බඳවා ගැනීම දිගටම සිදුකරගෙන යනු ලැබේ. ජෛව තාක්ෂණයේ වේගවත් ප්‍රගමනය තුල, SLIBTEC හරහා සැලකිය යුතු දායකත්වයක් සැපයිය හැකි බව අපි විශ්වාස කරමු.

වගකීම් සහගත මෙහෙයවීම SLIBTEC හි ප්‍රධාන සාධකයක් වේ. SLIBTEC යනු එහි මානව සම්පතකට පිබිදීමට ඉඩකඩ සලසන සමාගමක් විය යුතු බවට මම තරයේ විශ්වාස කරමි. මෙය ඉටු කිරීමට නිවැරදි මෙහෙවර නිර්මාණය කිරීම සහ අපගේ පළමු නිෂ්පාදන හා කාර්ය සාධන අපේක්ෂාව ගෙනහැර දැක්වීම මා ඇතුළු මගේ කණ්ඩායමේ ප්‍රමුඛතාවයකි. නව නිෂ්පාදන වෙනුවෙන් වන අභිලාෂය සහ ප්‍රතිඵල වෙනුවෙන් වන වගවීම, නිසි ලෙස පවත්වාගෙන යන ස්ථානයක් බවට පත්වීම අපගේ ඉලක්කයයි.

SLIBTEC හි සාර්ථකත්වය පිටුපස සිටින්නේ SLIBTEC කණ්ඩායම වන අතර ඉදිරියේදී ද SLIBTEC ආයතනය සාර්ථක වනු ඇති බවට විශ්වාස ය. 2021 වසර තුළ ළඟා කරගත් සියළු දේ සහ ඔවුන් ගෙන එන ශක්තිය වෙනුවෙන් ඔවුන් වෙත මම ස්තුතිවන්ත වන්නෙමි. 2022 වසර SLIBTEC ආයතනයට සුවිශේෂී වසරක් වනු ඇති බව මා තරයේ විශ්වාස කරමි. මන්ද යත්, අපගේ බොහෝ ජයග්‍රහණ අනාගතයේදී ඉදිරිපත් කිරීමට නියමිත බැවිනි.

අමාලි රණසිංහ
ප්‍රධාන මෙහෙයුම් නිලධාරී

අපගේ උපාය මාර්ගය

දැක්ම

ජෛව තාක්‍ෂණය සඳහා අන්තර්ජාතිකව වඩාත් පහසු ගමනාන්තයක් වෙමින් ශ්‍රී ලංකාව තුළ නවෝත්පාදනයන්ගෙන් මෙහෙයවනු ලබන ජෛව ආර්ථිකයක් සඳහා ගාමක බලවේගය බවට පත්වීම

මෙහෙවර

ගෝලීය ජෛව තාක්ෂණ මධ්‍යස්ථානයක් ලෙස ශ්‍රී ලංකාව ස්ථානගත කිරීම පිණිස කුසලතා පිරි මානව සම්පත් සංචිතයක් සංවර්ධනය කොට පවත්වා ගනිමින්, ශ්‍රී ලංකාවේ ආර්ථිකය සැලකිය යුතු ලෙස වර්ධනය කරන නව ජෛව තාක්‍ෂණ නිෂ්පාදන සහ සේවා ඉහළ නැංවීම කෙරෙහි අනෙකුත් අධි තාක්‍ෂණික අංශ සමඟ සහයෝගීව කටයුතු කරන අතරම, අති නවීන ජෛව තාක්ෂණ නවෝත්පාදන පරිසර පද්ධතියක් එකම ස්ථානයක නිර්මාණය කිරීම.

ව්‍යාපාර ආකෘතිය

ප්‍රධාන හවුල්කරුවන්

- මුදල් අමාත්‍යංශය
- තාක්ෂණ අමාත්‍යංශය
- ආයෝජන මණ්ඩලය
- ජාතික ඖෂධ නියාමන අධිකාරිය
- ශ්‍රී ලංකා රේගුව
- DAPH
- USAID

ප්‍රධාන ක්‍රියාකාරකම්

- උද්‍යාන සංවර්ධනය
- පර්යේෂණ කණ්ඩායම් සංවිධානය
- උපකරණ මිලදී ගැනීම

ප්‍රධාන සම්පත්

- මානව සම්පත
- යටිතල පහසුකම්
- භූමිය

වටිනාකම් යෝජනා

- ගුණාත්මක සේවාවන්
- පර්යේෂණාගාර පහසුකම්
- SLIBTEC උද්‍යානය
- ඉන්කියුබේටරය
- ගබඩා පහසුකම්
- කාර්යාල පහසුකම්

පාරිභෝගික සම්බන්ධතා

- දිරිදීමනා
- ප්‍රවර්ධන දීමනා
- සේවාවන්

නාලිකා

- අභිලාෂය ප්‍රකාශ කිරීම
- තොරතුරු අංග
- යෝජනා

පාරිභෝගික කාණ්ඩ

- ආයෝජකයින්
- පර්යේෂකයින්
- අන්තර්ජාතික සහකාරකවරුන්
- ව්‍යාපාර ප්‍රාග්ධනය සපයන්නන්
- අරමුදල් සපයන ආයතන
- විශ්ව විද්‍යාල
- සමාගම්
- නවක ව්‍යාපාර

වැය ව්‍යුහය

- කුලිය
- පොදුකාර්යය වියදම්
- නඩත්තු

ආදායම් මාර්ග

- ආයෝජන
- ප්‍රදාන
- කොන්ත්‍රාත් සේවා

ශදුඅත විශ්ලේෂණය

ශ
ශක්තීන්

- රාජ්‍ය සහාය
- ගුණාත්මකභාවය හා විශ්වාසය වෙනුවෙන් ඇපකැපවීම
- SLINTEC වෙත ප්‍රවේශය සහිතව හෝමගම, පිටිපන සුවිශේෂිව ස්ථානගත වීම
- ජෛවතාක්ෂණ නිෂ්පාදන ආයෝජකයින් සඳහා අක්කර 13.2 භූමිය
- ජාතික විශ්ව විද්‍යාල හා වෙනත් රජයේ පර්යේෂණ ආයතන සමඟ සමීප සබඳතා
- ජාත්‍යන්තර සංවිධාන ජාලය; අරමුදල් ලබා දෙන ආයතන හා පර්යේෂණ සහකාරකවරුන්
- ජාත්‍යන්තර/ ජාතික මට්ටමෙන් පැසසුමට ලක් වූ ඉහළ ගණයේ පර්යේෂණ විද්‍යාඥවරුන්
- විද්‍යාත්මක දත්ත විශ්ලේෂණ පහසුකම්

දු
දුර්වලතා

- පාර්ශ්වකරු සබඳතාවල සංකීර්ණ බව
- අභියෝගාත්මක නියාමන පරිසරය
- වඩා පුළුල් නිෂ්පාදන ක්‍රියාවලියක් සඳහා වූ සීමිත ඉඩකඩ
- යෝජිත කුලී පදනම මත පර්යේෂකයන් සඳහා දිරි දීමනා ලබාදීමේ සීමාකාරීකම්
- පාරිශ්‍රමික සීමා හේතුවෙන් අති දක්ෂයන් ආකර්ෂණය කරගැනීමේ දුෂ්කරතාව
- අභියෝගාත්මක නියාමන පරිසරය
- උපකරණ, පාරිභෝගික භාණ්ඩ හා සේවා සඳහා වෙළඳපල මිල ගණන්වල අවිනිශ්චිතතාව
- ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සීමාකාරීකම්

අ
අවස්ථා

- ආරුබොක්ක, ඔයාමඩුව හා මිල්ලෑව ඖෂධ උද්‍යාන සමග සහසම්බන්ධ වීම
- ICGEB සහයෝගීත්වය සමග අති-නවීන ජෛවතාක්ෂණ පර්යේෂණ සඳහා කලාපීය මධ්‍යස්ථානයක් වීම
- සහකාරක නිෂ්පාදන සංවර්ධනය පිණිස හවුල් අවකාශ සැපයීම
- අපේක්ෂාවන්ගෙන් පිරි ජෛවතාක්ෂණ පර්යේෂකයන් බිහිකිරීමේ අවකාශය
- ගෝලීය ජෛවතාක්ෂණ උද්‍යාන සමඟ පුළුල් සම්බන්ධතා
- නවෝත්පාදන වෙනුවෙන් උද්දීපිත නවක ව්‍යාපාර පරිසර පද්ධතියක් නිර්මාණය කිරීම
- සායනික/වෙනත් දත්ත පදනම් සහ ජෛවනිධි සහිත කලාපීය පර්යේෂණ මධ්‍යස්ථානවල සිට දත්ත බෙදාගැනීම සඳහා ප්‍රවේශය
- ජෛවතාක්ෂණ අපනයන වර්ධනය

ත
තර්ජන

- උද්‍යාන භූමියේ අයිතිය සුරක්ෂිත කර ගැනීම
- ආර්ථික අර්බුදය හේතු කොටගත් අපනයන සීමාකාරීකම්
- ප්‍රතිපත්තිමය මට්ටමෙන් ප්‍රමුඛතා වෙනස්වීම හේතු කොටගත් බාධාකාරී අභියෝග
- එතෙර ඇති වඩාත් හොඳ වරප්‍රසාද හේතුවෙන් සිදුවන “බුද්ධි ගලනය”
- වෙනස්වන තාක්ෂණයට අනුගතව උපකරණ මිලදී ගැනීමට සිදුවන ඉහළ ආයෝජනය
- ආර්ථික පරිමාණයේ සීමාවන් හේතුවෙන් අඩු ආයෝජක ආකර්ෂණය
- දූෂණය හා අපද්‍රව්‍ය බැහැර කිරීමේ ගැටළු/සීමා හේතුවෙන් අසලවැසි ප්‍රජාවන්ගේ ප්‍රතිරෝධය
- COVID-19 වසංගතය හේතුවෙන් පැන නැඟුණු අභියෝග
- නැගී එන කලාපීය වෙළඳපල

අපගේ අරමුණු උපායමාර්ගිකව ළඟා කර ගැනීම පිණිස, අපගේ සම්පත් ධරණීය ලෙස ප්‍රයෝජනයට ගැනීමට අපි ඉලක්ක කරන්නෙමු.

මානව සම්පත

ආයතනයක වඩාත් වැදගත්ම වත්කම සේවකයන් බව SLIBTEC විශ්වාස කරයි. එම නිසා, උපරිම ඵලදායීතාවක් ළඟා කර ගැනීමේ අරමුණින්, ඔවුන්ට ආයතනයේ ප්‍රතිපත්තීන් හා කාර්ය පටිපාටීන් කෙරෙහි අවධානය යොමු කළ හැකි වැඩ පරිසරයක් අප විසින් තහවුරු කර ඇත. 2021 දෙසැම්බර් 21 වන දා වන විට කාන්තාවන් 4ක් හා පිරිමි 9 ක් ලෙස සේවකයන් 13 කින් යුත් ශ්‍රම බලකායක් SLIBTEC ආයතනය සතුව සිටියි. 2022 වසර අවසානය වන විට මෙම සංඛ්‍යාව 35 දක්වා වැඩි කරගැනීමට අපේක්ෂිත අතර, ප්‍රධාන ලෙස පර්යේෂණ හා නවොත්පාදන වෙත අවධානය යොමු කරමින්, නව බඳවාගැනීම්වලින් බහුතරය පර්යේෂණ විද්‍යාඥයින් සහ මහාචාර්යවරුන් වනු ඇත.

සිය සේවක පිරිස සඳහා වන ප්‍රතිලාභ හා සුභසාධනය කෙරෙහි SLIBTEC ආයතනය දැඩි අවධානයක් යොමු කරන්නේ එවැනි ගැළපුම්, ප්‍රජාව හා සමාජ ජාලා තුළ ධනාත්මකව පිළිබිඹු වන අයුරින් සේවකයන්ගේ රාජකාරී ජීවිතය හා පෞද්ගලික ජීවිතය කෙරෙහි සැලකියයුතු ලෙස බලපෑම් ඇති කරනු ලබන බැවිනි. මෙම සුභසාධන ක්‍රියාවලියේ ප්‍රථම පියවර ලෙස, SLIBTEC සේවක පිරිස හා ඔවුන්ගේ පවුල් ආවරණය වන රක්ෂණ ඔප්පුවක් හඳුන්වා දීමට අපේක්ෂා කරනු ලැබේ.

.

මූල්‍ය අංශය

SLIBTEC ගමන්මඟ පුරා අප තබන සෑම පියවරකම හදගැස්ම මූල්‍යයි. SLIBTEC ආයතනයෙහි අරමුණ ඉදිරියට රැගෙන යාම හා ඊට සහාය වීම පිණිස ගොඩනංවන ලද අභ්‍යන්තර පාලක පද්ධතියක් මඟින් ධාවනය වනු ලබන මූල්‍ය දෙපාර්තමේන්තුව, ඍජු හා අවංකභාවය දැඩිව සුරකිමින් භාරකාරීත්ව භූමිකාවක් ඉටු කරනු ලබයි. ස්වයංක්‍රියකරණය හා අඛණ්ඩ වර්ධනය යනු මූල්‍ය තුළ අවධානය යොමු කළ යුතු ප්‍රධාන අංග වේ.

ආරම්භක පියවරයන් ලෙස ඉලෙක්ට්‍රොනික් අත්සන් තැබීම්, මාර්ගගත රැස්වීම් ක්‍රමවේදය ස්ථාපිත කිරීම හා මාර්ගගත බැංකුකරණ ක්‍රමයට යොමුවීම සිදු කර ඇති අතර, මාර්ගගත ගෙවීම් දොරටුවක් ස්ථාපිත කිරීම හා ERP පද්ධතියක් නිර්මාණය කිරීම මීළඟ අදියර ලෙස පවතී.

මුදල් ප්‍රවාහයන් කළමණාකරණය, පුරෝකථනය හා අයවැය සකස් කිරීම, මූල්‍ය හා කළමණාකරණ වාර්තා ප්‍රකාශයට පත්කිරීම, විගණන කළමණාකරණය සහ ගනුදෙනු සඳහා ගිණුම්කරණ කටයුතු ඉටු කරන අතරම, SLIBTEC ආයතනයෙහි යහපතම වෙනුවෙන් ක්‍රියාකිරීමේදී නිසි උද්‍යෝගය හා සැලකිල්ල පවත්වා ගන්නා බව තහවුරු කිරීමට

SLIBTEC ආයතනයට මඟපෙන්වීම හා සහාය ලබා දීම මූල්‍ය අංශය විසින් සිදු කරනු ලබයි.

ප්‍රසම්පාදනය

සේවාර්ථනය, කොන්දේසි සාකච්ඡා කිරීම, භාණ්ඩ මිලදී ගැනීම, අවශ්‍ය පරිදි භාණ්ඩ හා සේවා ලබා ගැනීම සහ පරීක්ෂා කිරීම සහ ක්‍රියාවලියේ සියලුම පියවරයන් පිළිබඳ වාර්තා තබා ගැනීම ඇතුළුව සමාගමට සිය දෛනික මෙහෙයුම් ඉටුකිරීමට සහාය වන භාණ්ඩ හා සේවා ලබා ගැනීමට අදාළ සෑම ක්‍රියාකාරකමකටම ප්‍රසම්පාදනය සම්බන්ධ වේ.

ප්‍රසම්පාදනය, ලාභදායීතාව වර්ධනය කිරීමෙහි ලා සංවිධානය තුළ අතිශය වැදගත් කාර්යභාරයක් ඉටුකරනු ලබයි. රජයට අයත් සමාගමක් ලෙස, SLIBTEC ආයතනය විසින් ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යායතනය විසින් ප්‍රකාශයට පත් කරන ලද භාණ්ඩ සහ වැඩ සඳහා වන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2006 සමඟ ශ්‍රී ලංකා රජයේ ප්‍රසම්පාදන පටිපාටිය අනුගමනය කරනු ලබයි.

කෙසේ නමුත්, සීමිත වගකීම් සමාගමක් ලෙස, SLIBTEC ආයතනය විසින් අභ්‍යන්තර ක්‍රියාවලීන්හි කාර්යක්ෂමතාවය වර්ධනය කිරීම පිණිස, ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූල වන පරිදි තමන්ගේම ප්‍රසම්පාදන ප්‍රතිපත්ති හා පටිපාටි සකස් කරගැනීමට අපේක්ෂා කරනු ලැබේ.

යටිතල පහසුකම්

පර්යේෂණාගාර පරිශ්‍රය තුළ සෞඛ්‍යය හා ආරක්ෂාව සමඟින් ගුණාත්මක වැඩ අවකාශ පිළිවෙත් ද පර්යේෂණාගාර තුළ යහපත් විද්‍යාගාර පිළිවෙත් ද පවත්වාගෙන යන බව තහවුරු කිරීම සඳහා පහසුකම් කළමණාකරණ පිළිවෙත් වැදගත් වේ. SLIBTEC ආයතන පරිශ්‍රයෙහි පහසුකම් කළමණාකරණ පිළිවෙත්වල මූලික අරමුණ වන්නේ සේවක පිරිස වෙනුවෙන් ප්‍රශස්ත වැඩ පරිසරයක් ලබා දීමයි.

තවද, ප්‍රවේශවීමේ හැකියාව ඉහළ නංවන සුරක්ෂිත වූ පහසුකම් සැපයීම, කාර්යක්ෂම අවකාශ භාවිතය තුළින් පර්යේෂණාගාර මෙහෙයුම් විධිමත් කිරීම සහ සමාගමෙහි මෙහෙයුම් හා ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ඉහළ විනිවිදභාවය තහවුරු කිරීම කෙරෙහි ද අවධානය යොමු කරනු ලැබේ.

අපි කවුද ?

ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් මත, ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් බයෝටෙක්නොලොජි (SLIBTEC) පුද්ගලික සමාගම 2020 ඔක්තෝම්බර් 12 වන දින රජය සතු සමාගමක් වශයෙන්, භාණ්ඩාගාර ලේකම්වරයා එකම කොටස් හිමියා වන ලෙස ස්ථාපිත කරන ලදී.

SLIBTEC සීමාසහිත පුද්ගලික සමාගම 2020 දෙසැම්බර් 11 වන දින තාක්ෂණ අමාත්‍යාංශය යටතේ ගැසට් කරනු ලැබුවේය. විශ්වවිද්‍යාල, රජයේ පර්යේෂණ ආයතන, පෞද්ගලික අංශය සහ ගෝලීය ජෛව තාක්ෂණ විශිෂ්ටතා මධ්‍යස්ථාන සමඟ ක්‍රමෝපායික හවුල්කාරිත්වයන් වර්ධනය කිරීම ප්‍රධාන අරමුණු වේ. 2025 වන විට අපනයන වෙළෙඳපොළ 1% කින් ඉහළ නැංවීම සඳහා අධි තාක‍ෂණික ජෛව තාකෂණික නිෂ්පාදන වලින් දායකත්වයක් ලබා ගැනීමට යොජිතයි.

අරමුණු

1. පර්යේෂණ හා නවෝත්පාදන, නියමු පිරියත්, සහ අධි තාක‍ෂණික නිෂ්පාදන ඉහළ නැංවීම සිදු කිරීම ගෝලීය යහ පිළිවෙත්වලට අනුගත වෙමින් හා සියළු ක්‍රියාකාරකම්වලදී තිරසාරභාවය වර්ධනය කරමින්, එක් භෞතික ස්ථානයක සිදු කළ හැකි වන පරිදි උපයෝගිතා, සැපයුම් සහ සියලුම ආධාරක පද්ධති සපයා හෝමාගම, පිටිපන පිහිටි ජාතික මධ්‍යගත ජෛව තාක‍ෂණ නවෝත්පාදන මධ්‍යස්ථානයක් වටා උසස් මට්ටමේ ජෛව තාක‍ෂණ නවෝත්පාදන සඳහා හිතකර පරිසර පද්ධතියක් නිර්මාණය කිරීම
2. අති නවීන ජෛව තාක්ෂණ නවෝත්පාදනයන් සඳහා යහ පිළිවෙත් අනුගමනය කරමින් හිතකර, නවීනතම පරිසර පද්ධතියක් ස්ථාපිත කිරීම, පහසුකම් සැලසීම සහ සහාය වීම
3. ඉහළ මට්ටමේ ජෛව තාක‍ෂණ කර්මාන්තයේ සංවර්ධනය වේගවත් කිරීම සඳහා නවෝත්පාදන සංස්කෘතියක් නිර්මාණය කිරීම
4. නිකේතන (niche) ක්ෂේත්‍රය තුළ ගෝලීය වෙළෙඳපොළ අවශ්‍යතා සපුරාලීම සඳහා නවක ජෛව තාක‍ෂණ කර්මාන්තය සංවර්ධනය
5. රට තුළ විචිත්‍රවත් වූ ඉහළ මට්ටමේ ජෛව තාක‍ෂණ නවක ව්‍යාපාර සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක සංස්කෘතියක් නිර්මාණය කිරීම
6. ජෛව තාක‍ෂණික මෙවලම් භාවිතයෙන් ධාරිතා ගොඩනැගීම, ගුණාත්මක අධ්‍යාපනය, පර්යේෂණ සහ ප්‍රචාරණ ක්‍රියාකාරකම් ඉහළ නැංවීම තුළින් රටේ ආර්ථික සංවර්ධනය පෝෂණය කිරීම

සංවිධානයේ වගකීම් හා භූමිකාව

SLIBTEC ආයතනය යනු සුවිශේෂී වූ පර්යේෂණ, සංවර්ධන සහ නවෝත්පාදන සංස්කෘතියක් සඳහා ඉඩ පාදමින්, සහාය පද්ධති ද සමඟින් ඒ උදෙසාම වෙන් වූ පහසුකම් තුළ නවීනතම තාක්ෂණයන් අඛණ්ඩව අනුගත කරගනිමින් නිර්මාණය කරන ලද, ඉහළ මට්ටමේ ජෛව තාක‍ෂණ නවෝත්පාදන සඳහා හිතකර වන වැඩ බිමකි. තවද, සියලු ක්‍රියාකාරකම්වල දී තිරසාර සංකල්ප ඇතුළු ගෝලීය යහ පිළිවෙත්වලට දැඩිව අනුගත වෙමින්, අවශ්‍යතාවට අනුකූල ව සැලසුම් කළ ජෛව තාක‍ෂණ බීජෞෂණ මධ්‍යස්ථාන (ඉන්කියුබේටර්) හා නිෂ්පාදනය එක් භෞතික ස්ථානයක් තුළ සිදු කිරීම මගින්, SLIBTEC ආයතනය විසින් ජෛව තාක‍ෂණ ව්‍යාපාර සඳහා රේඛීය පර්යේෂණ සහ සංවර්ධන නිෂ්පාදන වේදිකාවක් සපයනු ලබයි.

අපගේ දිගු කාලීන සාර්ථකත්වය පිළිබඳ සාමූහික වගකීම SLIBTEC මණ්ඩලය විසින් දරනු ලැබේ. SLIBTEC මණ්ඩලය විසින් අපගේ ක්‍රමෝපායික දිශානතිය පෙන්වාදීම, අපගේ ක්‍රමෝපාය අනුමත කිරීම සහ අපගේ ක්‍රමෝපායික අරමුණු ළඟා කරගැනීම පිණිස අපට අවශ්‍ය වන සම්පත් අප සතුව ඇති බව ද තහවුරු කරනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩලය

සජිත් ආටිගල
සභාපති
(2020 - 2021)

අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති සජිත් ආටිගල මහතා මුදල් අමාත්‍යාංශයේ, භාණ්ඩාගාර ලේකම්වරයා වන අතර මෙම පත්වීමට පෙර ශ්‍රී ලංකා මහ බැංකුවෙහි නියෝජ්‍ය අධිපති ලෙස සේවය කොට ඇත. ඔහු, ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙහි සභාපතිවරයා ලෙස ද සේවය කොට ඇති අතර, ලංකා බැංකුව, ශ්‍රී ලංකා වරාය අධිකාරිය හා ගුවන්තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය ඇතුළු ප්‍රධාන පෙළේ රජයට අයත් ව්‍යාපාර හා ව්‍යවස්ථාපිත මණ්ඩල කිහිපයක මණ්ඩලවල භාණ්ඩාගාරය නියෝජනය කරන ලදී. ආටිගල මහතා එක්සත් රාජධානියෙහි වොර්වික් විශ්ව විද්‍යාලයෙහි ප්‍රාමාණික සංවර්ධන ආර්ථික විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිලාභියෙකු වන අතර කොළඹ විශ්ව විද්‍යාලයෙහි භෞතීය විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිලාභියෙක් ද වෙයි.

අනුරාධ කුමාරසිරි
සභාපති
(වත්මන්)

දැනට මුදල් අමාත්‍යාංශයේ මහා භාණ්ඩාගාරයේ ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවෙහි අධ්‍යක්ෂ ජනරාල් ධූරය දරන අතර ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවයේ ජ්‍යෙෂ්ඨ ශ්‍රේණියේ නිලධාරියෙකි. වර්තමානයේදී, මුදල් අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයෙකු ලෙස සේවය කරනු ලැබේ. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යංශයෙහි අධ්‍යක්ෂවරයෙකු ලෙස, ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පාලක මණ්ඩලයේ නිල සාමාජිකයෙකු ලෙස සහ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කොමිෂන් සභා සාමාජිකයෙකු ලෙස සේවය කරනු ලබයි.

මහාචාර්ය කපිල පෙරේරා
අධ්‍යක්ෂ

2020 අගෝස්තු මාසයේ සිට මේ දක්වා අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා ලෙස සේවය කරයි. මොරටුව විශ්වවිද්‍යාලයේ, ඉංජිනේරු පීඨයේ පීඨාධිපතිවරයා ලෙසත්, මොරටුව විශ්වවිද්‍යාලයේ අධ්‍යක්ෂ - සැලසුම් ලෙසත්, 2020 අගෝස්තු මාසය දක්වා මොරටුව විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා ලෙසත් සේවය කර ඇත. තවද, උපාධි පාඨමාලා සහ පශ්චාත් උපාධි පාඨමාලා සඳහා බලශක්ති තාක්ෂණය සහ පරිසරය, මූලික තාප ගති විද්‍යාව, බලශක්ති ප්‍රභවයන් සහ තාක්ෂණය සහ ගොඩනැගිලිවල තාප හුවමාරු යෙදුම් ඇතුළු විවිධ විෂයයන් පිළිබඳ කථිකාචාර්යවරයකු ලෙස ද කටයුතු කර ඇත.

විශාකා අමරසේකර
අධ්‍යක්ෂ

දැනට අධ්‍යක්ෂවරයෙකු ලෙස මහා භාණ්ඩාගාරයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට අනුයුක්ත අතර මහා භාණ්ඩාගාරයේ වසර 15කට වැඩි පළපුරුද්දක් ඇත. එක්සත් රාජධානියේ ලන්ඩන් විශ්ව විද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව සහ කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධියක් සහ ඇමරිකා එක්සත් ජනපදයේ වැන්ඩර්බිල්ට් විශ්ව විද්‍යාලයෙන් සංවර්ධන ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇත. ඇය එක්සත් රාජධානියේ කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ වරලත් ආයතනයේ සාමාජිකාවක් වන අතර වරලත් රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීවරියකි. ලංවිම, CPC සහ මහජන බැංකුව ඇතුළු රාජ්‍ය ආයතනවල මණ්ඩලවල භාණ්ඩාගාරය නියෝජනය කරන ලදී.

මහාචාර්ය සිරිමලී ප්‍රනාන්දු
අධ්‍යක්ෂ

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨයේ ක්ෂුද්‍රජීව විද්‍යාව පිළිබඳ මහාචාර්ය. ශ්‍රී ලංකා ජාතික විද්‍යා පදනමෙහි සභාපතිනිය ලෙස වසර 12 කට වැඩි කාලයක් සේවය කර ඇත. 2006-2015 දක්වා ශ්‍රී ලංකාවේ විද්‍යා හා තාක්ෂණ අමාත්‍යවරයාගේ විද්‍යා උපදේශක ලෙස සේවය කර ඇති අතර, 2010 දී ශ්‍රී ලංකාව සඳහා ප්‍රථම ජාතික විද්‍යා තාක්ෂණ සහ නවෝත්පාදන උපාය මාර්ගය සකස් කරන ලදී. ජාත්‍යන්තර විද්‍යා කවුන්සිලයේ (ISC) පාලක මණ්ඩලයේ සාමාජිකාවක් සහ මුදල් හා අරමුදල් රැස්කිරීමේ කමිටුවේ උප සභාපති ලෙස ද කටයුතු කර ඇත. 2008 දී ශ්‍රී ලංකා නැනෝ තාක්‍ෂණ ආයතනය (SLINTEC) පිහිට වන ලද ජාතික නැනෝ තාක්‍ෂණ මුලපිරීමෙහි ප්‍රධාන කාර්යභාරයක් ඉටු කර ඇත. ආසියා සහ පැසිෆික් කලාපය සඳහා වන එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජ කොමිසමේ (UN-ESCAP) විධායක ලේකම්ගේ විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන (STI) උපදේශන මණ්ඩලයේ ආරම්භක සාමාජිකාවකි.

මහාචාර්ය අජන්ත ධර්මසිරි
අධ්‍යක්ෂ

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ (PIM) ආසන්නතම හිටපු අධ්‍යක්ෂ සහ කළමනාකරණ මණ්ඩලයේ සභාපතිවරයා වේ. වරලත් කළමණාකරුවෙකු, වරලත් මානව සම්පත් වෘත්තිකයෙකු සහ වරලත් විදුලි ඉංජිනේරුවරයෙකු වීමේ දුර්ලභ සුසංයෝගය සහිත ය. ශ්‍රී ලංකාවේ වරලත් පිරිස් කළමනාකරණ ආයතනයේ (CIPM) හිටපු සභාපති සහ ආසියා පැසිෆික් මානව සම්පත් කළමනාකරණ සම්මේලනයේ (APFHRM) උප සභාපතිවරයෙක්ද විය. ඔක්ලහෝමා විශ්ව විද්‍යාලයේ ප්‍රයිස් කොලේජ් ඔෆ් බිස්නස් හි අනුබද්ධ මහාචාර්යවරයෙකි. Sri Lankan Journal of Management (SLJM) හි පුරෝගාමී සංස්කාරකවරයා විය. මණ්ඩල කිහිපයක ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු වන අතර සහ පාලක සභා කිහිපයක සේවය කරයි.

ඉංජි. රනිල් විතාරණ
අධ්‍යක්ෂ

1993 දී එක්සත් රාජධානියේ ඉම්පීරියල් විද්‍යාලයෙන් ඉංජිනේරු උපාධිය ලැබ, 1987 දී ආරම්භ කරන ලද ඇස්තමේන්තුගත සේවක සේවිකාවන් 95,000 කින් යුත් යට ඇඳුම් නිෂ්පාදන සමාගමක් වන MAS හි ප්‍රධාන නවෝත්පාදන නිලධාරියා වේ. ඔහු ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනයේ (SLINTEC) අධ්‍යක්ෂවරයෙකු ද වෙයි.

ආචාර්ය සංකල්ප ගම්වරිගේ
අධ්‍යක්ෂ

වසර 20ට වැඩි ක්ෂේත්‍ර පළපුරුද්දක් සහිත නවෝත්පාදක ඩිජිටල් පරිවර්තන විශේෂඥයෙකු වන අතර, 2012 වසරේ සිට Zone24x7 හි ප්‍රමුඛ පෙළේ ඉංජිනේරු කුසලතා සංචිත 250කට වඩා වැඩි සංඛ්‍යාවක් සඳහා ඉංජිනේරු නායකයා ලෙස සේවය කරයි. Zone24x7 විසින් අයිතිය දරන හා ගොනු කරන ලද US පේටන්ට් බලපත්‍ර රැසකට දායක වී ඇත. SLASSCOM, TRACE, NSF, EDB සහ ලංකා වාණිජ මණ්ඩලය ඇතුළු ජාතික මුල පිරීම් සහ සංසද ගණනාවකට සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇත. මීට අමතරව, ඔහු මොරටුව විශ්ව විද්‍යාලයේ උපාධි අධ්‍යයන පීඨයේ අධ්‍යයන මණ්ඩලයේ සහ තොරතුරු තාක්ෂණ පීඨයේ BIT බාහිර උපාධි වැඩසටහනේ අධ්‍යයන කමිටුවේ සාමාජිකයෙකු ලෙස සේවය කර ඇත. දැනට ඔහු Nagarro හි ජ්‍යෙෂ්ඨ නායකයා ය.

අමාලි රණසිංහ
අධ්‍යක්ෂ

SLIBTEC හි ප්‍රධාන මෙහෙයුම් නිලධාරී. පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් ජෛව තාක්‍ෂණය පිළිබඳ විද්‍යාපති උපාධියක් ලබා ඇත. විද්‍යා හා තාක්ෂණ අංශයේ වසර 16කට වැඩි පළපුරුද්දක් සහිතව, ජාතික විද්‍යා පදනමේ සේවය කරන අතර ප්‍රතිපත්ති සංවර්ධනය සඳහා ජාතික කමිටු නියෝජනය කර ඇත. අධි තාක්‍ෂණික මුලපිරීමේ ප්‍රධානත්වය දැරීම පිණිස විද්‍යාව, තාක්‍ෂණය සහ නවෝත්පාදන සම්බන්ධීකරණ ලේකම් කාර්යාලයට (COSTI) සම්බන්ධ වීමට ඇයට ආරාධනා කරන ලද අතර සිය මූලික වගකීම ලෙස SLIBTEC ස්ථාපිත කිරීමේ සම්බන්ධීකරණ කාර්යය ඉටු කළාය.

අප ශාක හා ක්ෂුද්‍ර ජීවීන්ගේ සිට අණුක ව්‍යාධිජනකය සහ ඒන්නත් සොයා ගැනීම දක්වා පුළුල් විද්‍යාත්මක හූ දර්ශනයක් තුළ ක්‍රියාත්මක වන අතර අති නවීන ජීව විද්‍යාවන් සඳහා පර්යේෂණ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ක්‍රියාවලියේ යෙදී සිටිනු ලැබේ. අපගේ පර්යේෂකයන් පර්යේෂණ ප්‍රදාන කිහිපයක් ලබා ගැනීමෙහි ලා ඉතා සාර්ථක වී ඇත. ජෛව තාක්ෂණ පර්යේෂණ සඳහා නවීනතම උපකරණවලින් සමන්විත අතිනවීන පර්යේෂණාගාර ඇතුළු නවීනතම සම්පත් සැපයීම තුළින් සහ උපායමාර්ගික සංවර්ධනය සඳහා ජෛව තාක්‍ෂණ අංශ ගණනාවක් ආවරණය වන පරිදි ඉහළ මට්ටමේ සම්පත් සංචිත සමඟින්, SLIBTEC පර්යේෂණ වේදිකාව විසින් සිය ඊළඟ කඩඉම සාක්ෂාත් කර ගැනීම පිණිස ලෝක මට්ටමේ පර්යේෂණ සහ නවෝත්පාදනයන් බල ගන්වනු ඇත.

SLIBTEC පර්යේෂණ, බුද්ධිමය දේපල ආරක්ෂා කරමින් නවෝත්පාදනයන් ඉදිරියට ගෙන යාම පිණිස විද්‍යාත්මක විශිෂ්ටත්වය අත්පත් කර ගැනීම උදෙසා සඳහා බහුවිධ, සාමූහික ප්‍රවේශයක් මත ආකෘතිගත කර ඇත. ජාත්‍යන්තර සහයෝගිතාකරුවන් ඇතුළුව, පුළුල් ලෙස ක්‍රියාකාරී සිටින පර්යේෂණ සහ සංවර්ධන පරිසර පද්ධතියක් තුළ, ව්‍යාපාරික ප්‍රජාවද ද සමගින් ප්‍රතිඵල-පාදක නවෝත්පාදන පර්යේෂණ සැලසුම් කර ඇත.

ජාන ඉංජිනේරු සහ ජෛව තාක්‍ෂණය සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථානය (ICGEB) එහි සාමාජික රටවලට ජෛවචිකිත්සක නිෂ්පාදනවල තාක්‍ෂණ හුවමාරුවට සහාය වීමෙහි, පුහුණුවීම් හා ද්‍රව්‍ය සැපයීමෙහි සහ තත්ත්ව සහතික කිරීම සඳහා පහසුකම් සැලසීමේ පුරෝගාමියා වේ. ශ්‍රී ලංකාව එහි සාමාජික රටවලින් එකක් වන අතර බහුවිධ ජෛව ඖෂධ නිෂ්පාදන කම්හල් පිහිටුවීම සඳහා ඔවුන්ගේ තාක්‍ෂණ හුවමාරු පහසුකම සම්පූර්ණයෙන් ප්‍රයෝජනයට ගැනීම පිණිස ශ්‍රී ලංකා රජය, ජාත්‍යන්තර ජාන ඉංජිනේරු සහ ජෛව තාක්‍ෂණ මධ්‍යස්ථානයේ (ICGEB) දකුණු ආසියාව සඳහා කලාපීය පර්යේෂණ මධ්‍යස්ථානය SLIBTEC පර්යේෂණ බවට ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන ඇත

අපි මොනවාද කරන්නේ?

ජෛව තාක්‍ෂණයේ අතිවිශාල හැකියාවන් වෙත ප්‍රවේශ වීමට සහ ශ්‍රී ලංකාවේ ජෛව තාක්‍ෂණ කර්මාන්ත ප්‍රවර්ධනය කිරීමට, SLIBTEC සංරචක දෙකකින් සමන්විත වේ.

1. SLIBTEC පර්යේෂණ - නැගී එන ගෝලීය ඉල්ලුම සඳහා අති නවීන අංග සම්පූර්ණ ජෛව තාක්ෂණික විසඳුම්
2. SLIBTEC උද්‍යානය - ඉහළ මට්ටමේ ජෛව තාක්ෂණික නවෝත්පාදන සහ නිෂ්පාදන සඳහා එක් නැවතුම්පළක්

SLIBTEC පර්යේෂණ

ශ්‍රී ලංකාව සතුව දැනටමත් ජෛව තාක්‍ෂණය පදනම් කරගත් පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාවලීන් සිදු කරගෙන යාමට අවශ්‍ය මානව සම්පත් තිබේ. රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ විශ්ව විද්‍යාල විසින් විශේෂයෙන් අණුක ජීව විද්‍යාව සහ ජෛව තාක්‍ෂණය ඉලක්ක කර ගත් ජීව විද්‍යා උපාධි පිරිනමනු ලැබේ. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ ජෛව තාක්‍ෂණ පර්යේෂණ, නවෝත්පාදන සහ කර්මාන්තවල ලබා ඇති ප්‍රගතිය ප්‍රාමාණික නොවීම හේතුවෙන් මෙම ඉහළ නිපුණතා ඇති ශ්‍රම බලකාය ගෝලීය ඖෂධ සහ ජෛව තාක්‍ෂණ සමාගම් විසින් වැඩි කැමැත්තකින් බඳවා ගන්නා බැවින් ඔවුන් රට හැර යන තත්ත්වයට පත්ව ඇත. මේ සම්බන්ධයෙන් ගත් කළ, SLIBTEC පර්යේෂණ ශ්‍රී ලංකාවේ ජෛව තාක්ෂණ ක්ෂේත්‍රයට පමණක් නොව, දකුණු ආසියානු කලාපයේ සහ ගෝලීය වශයෙන් ද ප්‍රයෝජනවත් වන පර්යේෂණ සහ නවෝත්පාදන පරිසර පද්ධතියක් සංවර්ධනය කිරීම සඳහා අති නවීන යටිතල පහසුකම් සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කරයි. ජෛව තාක්‍ෂණ පර්යේෂණ සහ සංවර්ධන මැදිහත්වීම් තුළින් ආර්ථික හා සමාජීය සංවර්ධනයක් ඇති කිරීම සඳහා නවෝත්පාදන පරිසර පද්ධතිය සංවර්ධනය කිරීම පිණිස SLIBTEC පර්යේෂණ විසින් අධ්‍යයන, කර්මාන්ත සහ රජය සමඟ ත්‍රිත්ව හෙලික්ස ආකෘතිය අනුගමනය කරනු ඇත. ආරම්භයේදී, SLIBTEC පර්යේෂණ ප්‍රධාන පර්යේෂණ අංශයන් ලෙස කෘෂිජෛව තාක්‍ෂණය, ජෛව උපාංග, ජෛව තොරතුරුවේදය, ප්‍රතිජනක චිකිත්සකවේදය, ජෛව ඖෂධ, ජෛව ඉන්ධන සහ ජෛව පිරිපහදුව, අණුක රෝග විනිශ්චය සහ එන්නත් නිෂ්පාදන අංශයන් සඳහා ආයෝජනය කරනු ලැබේ.

කෘෂිජෛවතාක්ෂණය

කෘෂිජෛවතාක්ෂණවේදය යනු කෘෂිකාර්මික ක්‍රියාවලීන් සඳහා යොදා ගන්නා ජෛව තාක්‍ෂණවේදයයි. උදාහරණයක් ලෙස ක්ෂුද්‍ර ප්‍රචාරණය හරහා ශාක තෝරා ගැනීම සහ ගෘහාශ්‍රිතකරණය දැක්විය හැක. එක් අපේක්ෂාවක් වන්නේ, කෘෂිජෛවතාක්ෂණවේදය මගින්, පළිබෝධනාශක බාහිරව යෙදීමේ අවශ්‍යතාවය ඉවත් කරමින් පළිබෝධනාශකවල බලපෑම් ප්‍රකාශනය කළ හැකි ලෙස ශාකයක් සකස් කිරීම වැනි, සාම්ප්‍රදායික කර්මාන්තමය කෘෂිකර්මයට වඩා පරිසර හිතකාමී විසඳුම් ලබාදෙනු ඇති බවයි.

එය හරිත විප්ලවයේ මීළඟ අදියර ලෙස සාමාන්‍යයෙන් සැලකෙන අතර, වඩාත් සාරවත් හා ජීවී අජීවී ආතතීන් කෙරෙහි වඩාත් ප්‍රතිරෝධී ශාක නිර්මාණය කිරීම මගින් ලෝක කුසගින්න තුරන් කිරීමේ සඳහා අවස්ථාවක් වන අතර පරිසර හිතකාමී පොහොර භාවිතය සහතික කරනු ලබයි.

අණුක රෝග විනිශ්චය හා එන්නත් සංවර්ධනය

COVID-19 සමඟ, එන්නත් නිපදවීමේ ක්‍රමෝපායවල වැදගත්කම සහ අණුක රෝග විනිශ්චය කිරීමේ වැදගත්කම ශ්‍රී ලංකාව තුළ කරළියට පැමිණ පුළුල් ලෙස සාකච්ඡාවට බඳුන් විය. කෙසේ වෙතත්, අවශ්‍ය උපකරණ සහිත නවීන පහසුකම් නොමැතිකම හේතුවෙන් ප්‍රතිශක්තිකරණ වර්ධනය සහ වෛරස් ප්‍රබලතාවන් පිළිබඳ වැදගත් අධ්‍යයනයන් බොහොමයක් අත්හිටුවීමට සිදු විය.

COVID-19 පිළිබඳ අධ්‍යයනයන් පමණක් නොව, තවත් බොහෝ ආසාදන සහ ව්‍යාධිජනක රෝග ද එම හේතු නිසා පසුබෑමකට ලක් විය.

එබැවින් අණුක රෝග විනිශ්චය සහ එන්නත් නිපදවීම SLIBTEC හි ප්‍රධාන පර්යේෂණ අංශයක් වන අතර පර්යේෂණාගාරය දකුණු ආසියානු කලාපයේ සන්ධිස්ථානයක් වනු ඇත.

ජෛව ඖෂධ

SLIBTEC පර්යේෂණ විසින් ශ්‍රී ලාංකේය සාම්ප්‍රදායික වෛද්‍ය විද්‍යාවේ ජෛව තාක්‍ෂණික ප්‍රවේශයන් හඳුනා ගැනීමත් සමඟ නව්‍ය චිකිත්සක සැලසුම්කරණය සහ වර්ධනය කෙරෙහි ද අවධානය යොමු කරනු ලැබේ.

ශ්‍රී ලංකාව පාරම්පරික වෛද්‍ය විද්‍යාව පිළිබඳ ශ්‍රේෂ්ඨ ඉතිහාසයකට උරුමකම් කියයි. තවද, ජීව විද්‍යාත්මක උණුසුම් ස්ථානයක් වන ශ්‍රී ලංකාව ඖෂධීය වශයෙන් වැදගත් වන ශාක වර්ග රාශියකින් සමන්විත වන අතර ඒවායින් බොහොමයක් නිසි අයුරින් ලක්ෂණ හඳුනා ගැනීමටකට ලක් ව නැත.

එබැවින්, SLIBTEC පර්යේෂණ ජෛව ඖෂධ රසායනාගාරය, නව ඖෂධ මෙන්ම මිනිසාට ප්‍රයෝජනවත් වන පෝෂණ ද්‍රව්‍ය නිපදවීම කෙරෙහි ද අවධානය යොමු කරයි.

ජෛවතොරතුරුවේදය

DNA අනුක්‍රම නිර්ණය කිරීමේ හා දත්ත විශ්ලේෂණ පහසුකම් නොමැතිවීම හේතුවෙන් ප්‍රවේණි විද්‍යාව සහ ජාන විද්‍යාව පිළිබඳ බොහෝ අධ්‍යයනයන්ට ශ්‍රී ලංකාව තුළ කඩිනමින් ඉදිරියට යැමට නොහැකි වී ඇත. තවද, ජාන අධ්‍යයනයන්හි නව ප්‍රවේශයන්, එනම් එපිජෙනටික්, ක්‍රියාකාරී ප්‍රවේණි විද්‍යාව, අණුක හඳුනාගැනීම, ඖෂධ සොයාගැනීම් ආදිය ද අවශ්‍ය පරිගණක පහසුකම් නොමැතිකම නිසා සීමා විය.

එබැවින් SLIBTEC පර්යේෂණ සතු ජෛවතොරතුරුවේද පර්යේෂණාගාරය පර්යේෂණ සහ නවෝත්පාදනයන් මීළඟ මට්ටමට ගෙන යාමට හැකි ආකාරයේ විසඳුම් ලබා දීමට සූදානමින් සිටියි.

රසායනාගාරයේ සේවාවන් SLIBTEC පර්යේෂණ ආයතනයේ සෙසු විද්‍යාඥයින්ට පමණක් සීමා නොවන අතර අනෙකුත් රාජ්‍ය හා පෞද්ගලික ආයතනවලට මෙන්ම කාර්මික අංශය වෙනුවෙන් ද සැපයෙනු ලැබේ.

ජෛව ඉන්ධන හා ජෛව පිරිපහදුව

මෙම සියවස තුළ පොසිල ඉන්ධන අවසන් වන බවට අනාවැකිය පළ වී ඇති බැවින් හරිත ගැසොලින්, හරිත ඩීසල්, හරිත ජෙට් ඉන්ධන ඇතුළු හයිඩ්‍රොකාබන ජෛව ඉන්ධන සඳහා ගෝලීය වශයෙන් ඉහළ ඉල්ලුමක් පවතී.

තවද, මහා පරිමාණ එන්නත් සහ අනෙකුත් එන්සයිම සොයාගැනීමේ පර්යේෂණ අධ්‍යයනයන් සඳහා පැසවීම සහ පිරිපහදු පහසුකම් අවශ්‍ය වේ.

එබැවින්, SLIBTEC පර්යේෂණ සතු ජෛව ඉන්ධන සහ ජෛව පිරිපහදු පර්යේෂණාගාරය තුල ෆොසිල ඉන්ධන සඳහා ශක්‍යතාවයක් සහිත විසඳුම් සහ සාර්ථක වාණිජ නිෂ්පාදන සොයාගැනීම සඳහා වන පර්යේෂණ කටයුතු සිදු කරනු ලැබේ.

.

ප්‍රතිජනක චිකිත්සාවේදය

SLIBTEC පර්යේෂණ වැඩිදුරටත් පටක සහ අවයව සුව කිරීමට, හානි හෝ දෝෂ හේතුවෙන් ඒවායේ අඩපණ වූ ක්‍රියාකාරීත්වය යථා තත්ත්වයට පත් කිරීම ආදිය සඳහා සෛලීය ප්‍රතිශක්ති මූර්ජනය හෝ පටක ඉංජිනේරු ප්‍රතිකර්ම වැනි නව ප්‍රවේශයන් ඔස්සේ නව ප්‍රතිකාර ක්‍රම සංවර්ධනය කිරීමට ද සැලසුම් කරයි.

නව්‍ය ප්‍රතිකර්ම සංවර්ධනය කිරීම හා පුද්ගලාරෝපිත ඖෂධ සහ පිළිකා ප්‍රතිකාර සඳහා ප්‍රවේශයන් සංවර්ධනය කිරීමේ දැක්ම සහිතව නව යාන්ත්‍රණ සහ මාර්ග පිළිබඳ අවබෝධය වර්ධනය කිරීම සඳහා SLIBTEC පර්යේෂණ සතු ප්‍රතිජනක චිකිත්සාවේද පර්යේෂණාගාරය මෙම ක්ෂේත්‍රයන්හි පුළුල් ලෙස ක්‍රියාකාරී වනු ඇත.

ජෛව උපාංග



සාමාන්‍ය වෛද්‍ය පරීක්ෂණ වලදී නිරවද්‍ය සහ ඉහළ යථාතථ්‍ය භාවයකින් යුත් උපාංග වඩා කාර්යක්ෂම වේ. වර්තමානයේදී, සවිමත්, මිලෙන් අඩු, හැකි තරම් ආක්‍රමණික නොවන සහ අවම පුහුණුවක් ඇති පුද්ගලයින් විසින් ක්‍රියාත්මක කළ හැකි උපාංග සංවර්ධනය කර ඇත.

එබැවින්, අවසාන පරිශීලකයින් සමඟ සහයෝගීතාවයෙන් කාර්යය සඳහා සුදුසු ජෛව සංවේදක සංවර්ධනය, නැගී එන වගකීම් සහගත පර්යේෂණ සහ නවෝත්පාදන ආකෘතියේ හදවත වේ. එම නිසා, SLIBTEC පර්යේෂණ සතු ජෛව උපාංග පර්යේෂණාගාරය විසින් විශේෂිත ගැටළු සහ ගෝලීය අභියෝග යන දෙකටම ආමන්ත්‍රණය කරමින්, විවිධ විෂයයන් සඳහා වැඩි නිරවද්‍යතාවයකින් යුත් පිරිවැය-ඵලදායී සහ තථ්‍ය ජෛව සංවේදක සහ ජෛව උපාංග සංවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ.

SLIBTEC හි පර්යේෂණ සහ නවෝත්පාදන ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම සඳහා හිතකර පරිසරයක් නිර්මාණය කිරීම පිණිස පර්යේෂණ කමිටුවක් පත් කර ඇත. SLIBTEC පර්යේෂකයන්ට සාර්ථකව ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා උපදෙස් දීම සහ දිරිගැන්වීම සඳහා ජෛව තාක්ෂණවේදය පිළිබඳ ප්‍රමුඛ පෙළේ විශේෂඥයන්ගෙන් මෙම කමිටුව සමන්විත වේ. පර්යේෂණ කමිටුවේ සාමාජිකයන් වන්නේ;

මහාචාර්ය සිරිමලී ප්‍රනාන්දු
ක්ෂුද්‍රජීව විද්‍යාව පිළිබඳ මහාචාර්ය
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය

ඉංජී. රනිල් විතාරණ
ප්‍රධාන නවෝත්පාදන නිලධාරී
මාස් හෝල්ඩින්ග්ස්

SLIBTEC හි වත්මන් පශ්චාත් ආචාර්ය උපාධිධාරී විද්‍යාඥයන් වන්නේ,

අසංග කොට්ටහච්චිගේ
ආචාර්ය උපාධිධාරී (අණුක ක්ෂුද්‍රජීව විද්‍යාව)

ගයාන් විතානගේ
ආචාර්ය උපාධිධාරී (අණුක වසංගතවේදය)

චලිත සෝමරත්න
ආචාර්ය උපාධිධාරී (අණුක ජීව විද්‍යාව)

පේෂල ගුණසේකර
ආචාර්ය උපාධිධාරී (ප්‍රතිශක්ති විද්‍යාව)

SLIBTEC උද්‍යානය

ජෛව තාක්ෂණ උද්‍යාන විද්‍යාඥයින්ට සහ ව්‍යාපාරවලට ජෛව තාක්ෂණවේදය පදනම් කරගත් නිෂ්පාදන සංවර්ධනය සඳහා සහ ඒවායේ වාණිජකරණය වේගවත් කිරීම සඳහා නියමු අධ්‍යයනයන් සිදුකිරීමට පහසුකම් සපයයි. තවද, මෙම ජෛව තාක්ෂණ උද්‍යාන මඟින් බීජ ප්‍රදාන, ඉඩකඩ සහ පහසුකම් සපයන අතර, ව්‍යවසායකයින් අතර නවෝත්පාදන සඳහා පහසුකම් සලසමින් නවක ජෛව තාක්ෂණ ව්‍යාපාර සඳහා රැකවරණය ද සපයයි. ජෛව තාක්ෂණ නිෂ්පාදන සංවර්ධනය සඳහා අවශ්‍ය යන්ත්‍ර හා උපකරණ අතිශයින් මිල අධික වන අතර බොහෝ විට නවක ජෛව තාක්ෂණ ව්‍යාපාරකයින්ට මෙම වියදම් දරාගත නොහැකි බැවින් ශ්‍රී ලංකාව සඳහා මෙය සිදු කළ යුතුම දෙයකි.

නවකයින් හට ඔවුන්ගේ භාවිතය වෙනුවෙන් ගෙවීම් සිදු කොට භාවිතා කළ හැකි, අවශ්‍ය උපකරණවලින් සමන්විත පර්යේෂණාගාර අවකාශයන් තිබීම ඉතා අගනේ ය. මෙය ශ්‍රී ලංකාව තුළ ජෛව තාක්ෂණ ක්ෂේත්‍රයේ පර්යේෂණ, දියුණුව හා නවෝත්පාදන සඳහා තල්ලුවක් වනු ඇති අතර දීර්ඝ කාලීනව රටේ ආර්ථිකයට විශාල ධනාත්මක බලපෑමක් ඇති කරනු ඇත.

ශ්‍රී ලංකාවේ ප්‍රථම ජෛව තාක්ෂණ නවෝත්පාදන උද්‍යානය පිහිටුවීම මගින් ජෛව තාක්ෂණ අංශයේ නවෝත්පාදනයන් ප්‍රවර්ධනය කිරීම සඳහා, ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් බයෝටෙක්නොලොජි (SLIBTEC) ආයතනය එක්සත් ජනපද රජයේ සංවර්ධන අංශය වන ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද නියෝජිතායතනය (USAID)

සමඟ සහයෝගයෙන් කටයුතු කර ඇත. SLIBTEC ආයතනය විසින්, දේශීය හා ගෝලීය වෙළෙඳපොළ සඳහා ගෝලීය වශයෙන් තරඟකාරී නිෂ්පාදන සහ සේවා සැපයීම සඳහා අධි තාක්‍ෂණික ජෛව තාක්‍ෂණ කර්මාන්ත ස්ථාපිත කරනු ඇත. හරිත සංකල්පවලට අනුකූල වෙමින්, ජෛව තාක්‍ෂණ නිෂ්පාදන සහ නවක ව්‍යාපාර මෙහෙයුම් සඳහා අත්‍යවශ්‍ය පහසුකම් සහිතව, හෝමාගම පිටිපන අක්කර 13.2 කින් යුත් ඉඩම වෙන් කර ඇත. නවෝත්පාදන උද්‍යාන පහසුකම් පැකේජයට යටිතල පහසුකම් වන මාර්ග, ජලය, විදුලිය, සන්නිවේදනය සහ පාරිසරික අනුමැතිය වැනි මූලික අවශ්‍යතා ඇතුළත් වේ. නවක ව්‍යාපාර මෙහෙයුම් සඳහා කාර්යාල සහ පර්යෙෂණාගාර අවකාශ හා ගබඩා පහසුකම් පුද්ගලික ජෛව තාක්‍ෂණ ආයතන වෙත දිගුකාලීනව බදු දෙනු ලැබේ.

නව අවස්ථාවන් පිළිබඳ අපේක්ෂා සහගත වීමට හා ළඟා කර ගැනීමට සමාගම්වලට සහාය වීම මගින්, SLIBTEC උද්‍යානය ජෛව තාක්‍ෂණ ව්‍යාපාරය සඳහා ගෝලීය උණුසුම් ස්ථානයක් බවට පත්වනු ඇති බවට අපේක්ෂා කරනු ලැබේ. ලෝක මට්ටමේ පහසුකම් අතර අද්විතීය සහ පුළුල් වූ වත්කම් සමූහයක් අන්තර්ගත කොට ඇති අතර, භාවිතා කොට ගෙවීම් සිදු කිරීමේ පදනමින් ව්‍යවසායකයන් සඳහා ලබා දෙනු ඇත. ගුණාත්මක නිෂ්පාදනය සඳහා අවශ්‍ය මධ්‍යගත බහුවිධ පර්යේෂණ, ඉන්කියුබේටරය, ගබඩාව සහ නියමු පිරියත් පහසුකම් ඇතුළු සියලු මූලික පහසුකම් සහිත භාවිතයට සූදානම් ඉඩම, තිරසාර ව්‍යාපාර සඳහා අධි තරඟකාරී නමුත් සහයෝගී සංස්කෘතියක් නිර්මාණය කරන තාක්‍ෂණික පෙරටුගාමීන් සහ ව්‍යාපාර ප්‍රාග්ධනය සම්බන්ධ කර ගැනීමට ඉඩ ප්‍රස්ථාව සපයයි.

රැකවරණ (ඉන්කියුබේටර්) පහසුකම සැලසුම් කරන ලද්දේ නව ජෛව තාක්‍ෂණ කර්මාන්ත නිර්මාණය කරමින්, සංකල්පය බිහිවීමේ සිට වාණිජකරණය දක්වා ම ජෛව තාක්‍ෂණ ව්‍යවසායකයින්ගේ වර්ධනය වේගවත් කිරීම සඳහා කිරීම සඳහා ය. මෙම උද්‍යානය මගින්, වේගවත් සේවාවන් හරහා එක් නැවතුම්පළකින්, ස්ථාපිත සමාගම් සහ නවක ව්‍යාපාර සඳහා අද්විතීය හා පරිපූර්ණ තුලිතතාවයකින් යුක්ත ව තාක්‍ෂණ සහාය, පර්යේෂණ හා නවෝත්පාදන හැකියාවන්, සහ රජයේ නියාමන අවශ්‍යතා සම්බන්ධ සහාය සපයනු ලැබේ. SLIBTEC උද්‍යානයේ යෝජිත "රිවෝල්ටා" ඉන්කියුබේටරය මෙම සීමාවන්ට විසඳුම් ලබා දෙනු ඇත. මන්දයත් මෙම පහසුකම නවකයින් සඳහා ඉඩ ලබා දීමෙන් පමණක් නොව අදාළ ආයතන වෙත කළමනාකරණ, නියාමන සහ උපදේශන සේවා සඳහා පහසුකම් සැලසීම මගින් ද ධනාත්මක පරිසරයක් නිර්මාණය කරනු ඇත. එපමණක් නොව, ස්වාධීනව ක්‍රියාත්මක වන අති නවීන පර්යේෂණ සහ සංවර්ධන මූලික පහසුකම් වලට ආසන්නව රිවෝල්ටා ඉන්කියුබේටරය පිහිටුවා ඇත. තවද, නියාමන සේවා, ව්‍යාපාර ප්‍රාග්ධන සපයන්නන් සහ වෙනත් ආශ්‍රිත සේවාවන් සඳහා කාර්යාල අවකාශයන්, පැසවීම් නියමු පරීක්ෂණ පහසුකම් සහිත වියළි හා තෙත් පර්යේෂණාගාර, පුහුණු පර්යේෂණාගාරය ඇතුළත් මහල් තුනකින් මෙම යෝජිත "රිවෝල්ටා" සමන්විත වේ.

නවීනතම පර්යේෂණ සහ සංවර්ධන ඇතුළු අනෙකුත් උසස් තාක්ෂණයන් සහිත පරිසරයක ස්ථානගත වීම සහ ඉහළ මට්ටමේ සංවර්ධනයන් සඳහා නවෝත්පාදන පරිසර පද්ධතිය ඒකාබද්ධ කරන ස්වාධීනව ක්‍රියාත්මක වන මූලික පහසුකම්වලින් සමන්විත පරිසරයක ස්ථානගත වීම තුළින් SLIBTEC උද්‍යානයට ප්‍රතිලාභ සැලසේ.

පාරිසරික තිරසාරභාවය

පාරිසරික කළමණාකරණය පිළිබඳ ජාතික නීති

ශ්‍රී ලංකාවේ, පරිසර අමාත්‍යාංශය යටතේ ඇති මධ්‍යම පරිසර අධිකාරිය (CEA) විසින් බලාත්මක කරන ලද 1988, 2000 සහ 2022 හි සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත (NEA) විසින් පරිසරයට බලපාන සියලුම ක්‍රියාකාරකම් නියාමනය කරනු ලබයි. මධ්‍යම පරිසර අධිකාරිය පරිසර කළමනාකරණය සඳහා වගකිව යුතු ප්‍රධාන රාජ්‍ය ආයතනය වන අතර පරිසර දූෂණය පදනම් කරගත් සාපරාධී වැරදි සම්බන්ධයෙන් කටයුතු කිරීමට බලය ඇත

1988 අංක 56 දරන ජාතික පාරිසරික (සංශෝධන) පනතේ IV ඇ කොටස, ව්‍යාපෘති අනුමත කිරීම, අනුව පාරිසරික බලපෑම් ඇගැයීමේ (EIA) ක්‍රියා පටිපාටිය අනුගමනය කළ යුතු නියමිත ව්‍යාපෘති, NEA යටතේ 1999 නොවැම්බර් 05 වැනි දින අංක 1104/22 දරන ගැසට් පත්‍රය මගින් සංශෝධිත 1993.06.24 දිනැති අංක 772/22 දරන ගැසට් පත්‍රයේ 23 Y වගන්තිය යටතේ අනුපිළිවෙලින් ලැයිස්තුගත කර ඇත. ඒ අනුව, "භූමි ප්‍රමාණය හෙක්ටයාර 10 ඉක්මවන සියලුම කර්මාන්තපුර සහ උද්‍යාන සංවර්ධනය කිරීම" නියමිත ව්‍යාපෘති ලැයිස්තුවට ඇතුළත් වේ. යෝජිත SLIBTEC උද්‍යාන ව්‍යාපෘති භූමියේ භූමි ප්‍රමාණය අක්කර 13.2 ක් පමණක් (හෙක්ටයාර 10 ට අඩු) වන බැවින්, මධ්‍යම පරිසර අධිකාරියේ මඟපෙන්වීම යටතේ SLIBTEC ආයතනය විසින් කාර්මික තාක්ෂණික ආයතනය (ITI) හරහා මූලික පාරිසරික පරීක්ෂණ (IEE) අධ්‍යයනයක් සිදු කරන ලද අතර මධ්‍යම පරිසර අධිකාරිය විසින් පාරිසරික නිෂ්කාශනය ලබා දී ඇත.

ගෝලීය සබඳතා

ජෛව නවෝත්පාදනය සඳහා උපකාර කිරීම පිණිස ලෝකයේ වැඩිම බලපෑමක් ඇති කළ හැකි විද්‍යාත්මක සංවිධාන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට SLIBTEC ආයතනය පෙරමුණ ගනු ඇත. SLIBTEC ආයතනය විසින් ජෛව තාකෂණික ක්ෂේත්‍රයේ අනාගත නායකයින් බිහි කරන අතර ඒ තුළින් ශ්‍රී ලාංකික පොදු ජනතාවටද සේවයක් සැලැසෙනු අතර. SLIBTEC ආයතනය විසින් 2021 වර්ෂයේදී පහත ප්‍රදාන සඳහා ඉල්ලුම් කර ඇත.

1. **ජාත්‍යන්තර සංවර්ධනය සඳහා එක්සත් ජනපද නියෝජිතායතනය (USAID)**

ශ්‍රී ලංකා ජෛව තාක්ෂණ ආයතනය (SLIBTEC) ශ්‍රී ලංකාවේ ප්‍රථම ජෛව තාක්‍ෂණ නවෝත්පාදන උද්‍යානය පිහිටුවීම මගින් ජෛව තාක්‍ෂණ අංශයේ නවෝත්පාදනයන් ඉහළ නංවනු වස්, ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද නියෝජිතායතනය (USAID) සමඟ සහයෝගයෙන් කටයුතු කරනු ඇත. මෙම මැදිහත්වීම මගින් ශ්‍රී ලංකාවේ අධි තාක්‍ෂණික අපනයන අවම වශයෙන් 1% කින් ඉහළ නැංවීමට SLIBTEC අපේක්ෂා කරයි. 2021 අප්‍රේල් 08 වන දින USAID වෙත යෝජනාව ඉදිරිපත් කරන ලද අතර වෙළඳ, ජාතික වියදම් සහ ආදායම් ක්‍රියාකාරකම්වල ප්‍රතිඵල වේගවත් කිරීම සඳහා වූ හවුල්කාරිත්වය (PARTNER) විසින් සිය ආයතනික සංවර්ධනය සහ නවෝත්පාදන උද්‍යානයක් නිර්මාණය කිරීම ඇතුළු SLIBTEC හි අවශ්‍යතාවන් ඉටුකිරීම පිණිස තාක්ෂණික සහාය සහ ධාරිතා වර්ධන වැඩසටහනට සහාය වීම සඳහා සහයෝගිතා ලිපියක් අත්සන් කර ඇත.

2. **ආසියානු සංවර්ධන බැංකුව (ADB)**

ආහාර සුරක්ෂිතතාව වැඩිදියුණු කිරීමට සහ දිළිඳුකම අවම කිරීමට ජෛව තාක්‍ෂණවේදය විසින් අපට නව මෙවලමක් ලබා දී ඇත. පසුගිය දශකය පුරාවට ආසියාව මුහුණ දුන් ප්‍රධාන අභියෝගයක් වන්නේ ජෛව තාක්‍ෂණ පර්යේෂණ හා සංවර්ධන කළමනාකරණයයි. ආසියානු සංවර්ධන බැංකුව (ADB) විසින් එහි සංවර්ධනය වෙමින් පවතින සාමාජික රටවලට ජෛව තාක්‍ෂණවේදය ආරක්ෂිතව හා ඵලදායී ලෙස භාවිතා කිරීම පිණිස අරමුදල් සපයනු ලැබේ. COVID-19 වසංගතය සමඟ, ශ්‍රී ලංකාවේ ප්‍රධාන අවශ්‍යතාවයක් වූයේ හොඳින් සන්නද්ධ වෛරස පර්යේෂණාගාරයකි. එබැවින්, වෛරස් විද්‍යා පර්යේෂණ සහ සංවර්ධනයන අංශයෙන් රටෙහි ක්ෂණික අවශ්‍යතාවයක් වූ වෛරස පර්යේෂණාගාරය පිහිටුවීම සඳහා SLIBTEC ආයතනය විසින් 2021 මැයි 10 වන දින අරමුදල් ඉල්ලා යෝජනාවක් ඉදිරිපත් කරන ලදී.

3. **යුරෝපානු සංගමය (EU)**

ශ්‍රී ලංකාව අනාදිමත් කාලයක සිට කෘෂිකාර්මික රටක් වුවද මෙරට කෘෂි තාක්‍ෂණ ක්ෂේත්‍රය තවමත් පවතින්නේ නව අවධියක ය. බොහෝ රටවල් ජෛව තාක්‍ෂණික ප්‍රවේශයන් මත පදනම්ව වඩාත් කාර්යක්ෂම ශාක ප්‍රභේද සංවර්ධනය කිරීම සඳහා ආයෝජන සිදු කර ඇතත්, මනා ලෙස සංවර්ධිත පහසුකම් නොමැතිකම හේතුවෙන් හටගත් බාධක ජය ගැනීමේ අරගලයක රටේ විද්‍යා ප්‍රජාව නිරතව සිටිති. මේ සම්බන්ධයෙන්, ප්‍රධාන පර්යේෂණ අංශයක් ලෙස ශාක ජෛව තාක්‍ෂණ අංශය සඳහා SLIBTEC ආයතනය විසින් ආයෝජනය කරනු ලබන අතර ආධාරක පහසුකම් සංවර්ධනය කිරීම සඳහා SLIBTEC ආයතනය 2021 ජුනි 16 වන දින යුරෝපා සංගමයට ව්‍යාපෘති යෝජනාවක් ඉදිරිපත් කරන ලදී.

4. ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය (JICA)

ජෛව විවිධත්ව උණුසුම් ස්ථානයක් (Biodiversity Hotspot) ලෙස, ඒකදේශීය ඖෂධීය සහ ආර්ථික වශයෙන් වටිනා ශාක හා සත්ව විශේෂ රාශියකින් ශ්‍රී ලංකාව පොහොසත් ය. මෙම වැදගත් ප්‍රභේද බොහොමයක් පිළිබඳ අධ්‍යයනයන් හෝ ඒවායේ ලක්ෂණ හඳුනා ගැනීම හෝ සිදු කර නොතිබුණද, පරම්පරා ගණනාවක් පුරා උරුම වූ සාම්ප්‍රදායික ඖෂධ සහ ප්‍රතිකාර ක්‍රම පිළිබඳ විශාල ඉතිහාසයක් රටට ඇත. එබැවින්, SLIBTEC ආයතනය විසින් ජෛව ඖෂධ සහ ශාක ජෛව තාක්ෂණ අංශ සඳහා ආයෝජනය කරනු ලබන අතර ආධාරක පහසුකම් සංවර්ධනය කිරීම සඳහා ජූනි 18 වන දින ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනයට (JICA) ව්‍යාපෘති යෝජනා දෙකක් ඉදිරිපත් කරන ලදී.

5. කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය (KOICA)

1991 සිට කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය (KOICA) සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා ප්‍රදාන ආධාර වැඩසටහන් අඛණ්ඩව ව්‍යාප්ත කරමින් සිටී. අඩු ආදායම්ලාභී රටක් වන බැවින්, ශ්‍රී ලංකාවේ නවක සහ මුල් අවධියේ සමාගම් සඳහා අධි තාක්‍ෂණ සම්පත් සීමිත ය. ගෝලීය ප්‍රමිතීන්ට අනුකූලව ඉන්කියුබේටර් පහසුකම් නොමැතිකම හේතුවෙන් රටේ ආරම්භක ව්‍යාපාරවලට සංකල්පීයකරණයේ සිට අවසාන නිෂ්පාදන වාණිජකරණය දක්වා බොහෝ බාධාවන්වලට මුහුණ දීමට සිදු ව ඇත. අවශ්‍යතා සැලකිල්ලට ගනිමින්, SLIBTEC ආයතනය විසින් SLIBTEC උද්‍යානයේ ප්‍රධාන අංගයක් ලෙස "රිවෝල්ටා" ඉන්කියුබේටර් පහසුකමක් යෝජනා කරන ලදී. තවද, රෙගුලාසිවලට අනුව ද්‍රව්‍ය හුවමාරුව ද දුෂ්කර ක්‍රියාවලියක් වන බැවින්, රට තුළ ලාභදායී ක්‍රමවේදයන් සහිත අනුක්‍රමණ නීර්ණ පහසුකම් නොමැතිකම නිසා, ශ්‍රී ලාංකේය පර්යේෂණ සහ නවෝත්පාදන (R&I) ජෛව තාක්‍ෂණ සමාගම් පසුගාමී වී ඇත. එබැවින්, SLIBTEC ආයතනය විසින් 2021 ඔක්තෝබර් 21 දින කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය (KOICA) වෙත ව්‍යාපෘති යෝජනාවක් ඉදිරිපත් කරන ලදී.

වැදගත් ප්‍රදානයන්- 2021

ප්‍රදාන යෝජනා ක්‍රමය	ව්‍යාපෘති මාතෘකාව	ප්‍රධාන විමර්ශක	SLIBTEC කණ්ඩායම	කාල රාමුව	භාරදුන් දිනය	තත්ත්වය
USAID	disruptive innovation සඳහා ක්‍රමෝපායික සංවර්ධනය	අමාලි රණසිංහ	ආචාර්ය ගයාන් විතානගේ	ආරම්භයේ සිට මාස 24	2021.08.04	සහයෝගිතා ලිපිය අත්සන් තබා ඇත
ADB	වෛරස පර්යේෂණාගාරය වෙනුවෙන් උපකරණ ආධාර	අමාලි රණසිංහ	ආචාර්ය ගයාන් විතානගේ ආචාර්ය අසංග කොට්ටහච්චිගේ	වසර 2	2021.10.05	ලංසු කැඳවීමට ඉල්ලීම
EU ප්‍රදාන	රටෙහි ප්‍රබල අවශ්‍යතාවයක් සපුරාලනු පිණිස SLIBTEC හි කෘෂි-ජෛවතාක්ෂණ පර්යේෂණාගාරය නිර්මාණය කිරීම පිණිස තාක්ෂණික සහාය	අමාලි රණසිංහ	ආචාර්ය ගයාන් විතානගේ ආචාර්ය අසංග කොට්ටහච්චිගේ ආචාර්ය චලිත සෝමරත්න	වසර 3	2021.16.06	ඊළඟ සැසිය දක්වා කල් දමන ලදී

JICA	රටෙහි ප්‍රබල අවශ්‍යතාවයක් සපුරාලනු පිණිස SLIBTEC හි කෘෂි-ජෛවතාක්ෂණ පර්යේෂණාගාරය නිර්මාණය කිරීම පිණිස තාක්ෂණික සහාය	අමාලි රණසිංහ	ආචාර්ය ගයාන් විතානගේ ආචාර්ය අසංග කොට්ටහච්චිගේ	වසර 3	2021.18.08	**ඊළඟ සැසිය දක්වා කල් දමන ලදී**
KOICA	හෝමාගම, පිටිපන අධි-තාක්ෂණ ජෛව තාක්ෂණ නවෝත්පාදන පරිසර පද්ධතිය වැඩිදියුණු කරනු පිණිස උද්දීප්ත නවක ව්‍යාපාර සංස්කෘතියක් ඇති කිරීමට SLIBTEC උද්‍යානයෙහි "රිවොල්ටා" ඉන්කියුබේටර පහසුකම	අමාලි රණසිංහ	ආචාර්ය ගයාන් විතානගේ ආචාර්ය අසංග කොට්ටහච්චිගේ ගයාන් පීරිස්	වසර 2	2021.21.10	අයදුම්පත භාර දෙන ලදී

මූල්‍ය සාරාංශය

ස්වාධීන විගණන වාර්තාව

සභාපති
ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් බයෝටෙක්නොලොජි

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12වන වගන්තියට අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස 14ක කාලසීමාව සඳහා ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් බයෝටෙක්නොලොජී ආයතනයෙහි මූල්‍ය ප්‍රකාශ සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ විගණකාධිපතිගේ වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශ

1.1 මතය

2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය හා විස්තීර්ණ ආදායම් පිළිබඳ ප්‍රකාශය, අවසන් වූ මාස 14 සඳහා මුදල් සමානයන් හා මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය හා සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශයක් ඇතුලත් මූල්‍ය ප්‍රකාශවලට සටහන්වලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස 14 සඳහා ශ්‍රී ලංකා ජෛවතාක්ෂණ ආයතනයේ ("සමාගමේ") මූල්‍ය විගණනය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුව මාගේ මගපෙන්වීම යටතේ සිදු කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුව යථාකාලයේදී මාගේ වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කරනු ඇත.

මාගේ මතය පරිදි, යා කර ඇති මූල්‍ය ප්‍රකාශ මගින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්වලට අනුව අවසන් වූ මාස 14 සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සහ 2021 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ දැක්මක් ඉදිරිපත් කරයි.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. එම ප්‍රමිතීන් යටතේ මගේ වගකීම් මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශ පිළිබඳ විගණනය සඳහා විගණකාධිපතිවරයා සතු වගකීම් කොටසේ වැඩිදුරටත් විස්තර කර ඇත. මගේ මතය සඳහා පදනමක් සැපයීමට මා විසින් ලබා ගත් විගණන සාක්ෂි ප්‍රමාණවත් හා යෝග්‍ය වනු ඇති බව මගේ විශ්වාසයයි.

1.3 2021 සමාගමේ වාර්ෂික වාර්තාවේ ඇතුලත් කර ඇති වෙනත් තොරතුරු

2021 සමාගමේ වාර්ෂික වාර්තාවේ ඇතුලත් කර ඇති විස්තරවලින් වෙනත් තොරතුරු සමන්විත වන නමුත්, මූල්‍ය ප්‍රකාශ හෝ ඒ පිළිබඳ මගේ විගණන වාර්තාව ඇතුලත් නොවන අතර, මෙම විගණන වාර්තාවේ දිනයට පසු එම තොරතුරු ලැබීමට අපේක්ෂිතය.

මූල්‍ය ප්‍රකාශ පිළිබඳ මගේ මතය මගින් වෙනත් තොරතුරු ආවරණය නොවන අතර, මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක වගකීමක් හෝ නිගමනයක් පල නොකරමි.

මූල්‍ය ප්‍රකාශ පිළිබඳ මගේ විගණනයට අදාලව ලද අවස්ථාවන්හිදී ඉහතින් හඳුනාගත් වෙනත් තොරතුරු කියවා, එසේ සිදු කිරීමේදී, මූල්‍ය ප්‍රකාශ වෙනත් තොරතුරු හෝ විගණනයේදී මා විසින් ලද දැනුම සමඟ අතිශයින් අනනුකූල වන්නේද යන්න හෝ වෙනත් යම් අයුරකින් වැරදි ලෙස සඳහන් වී ඇත්ද යන්න සලකා බැලීම මගේ වගකීමයි.

සමාගමේ 2021 වාර්ෂික වාර්තාව මා කියවීමේදී, එහි අතිශයින් වැරදි තොරතුරු ඇති බවට මම නිගමනය කරන්නේ නම්, නිවැරදි කිරීම සඳහා පාලනය සිදු කරන පාර්ශ්වයන් වෙත මෙම කරුණ සන්නිවේදනය කිරීමට මම බැඳී සිටිමි. එහි තවදුරටත් වැරදි ප්‍රකාශ අන්තර්ගත වන්නේ නම්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ

154(6) ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට නියමිත මගේ වාර්තාවේ එම වැරදි ප්‍රකාශ අන්තර්ගත කරනු ඇත.

1.4 කළමනාකරණය සහ මූල්‍ය ප්‍රකාශ සම්බන්ධ පාලනයට වගකිව යුතු පුද්ගලයින්ගේ වගකීම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්වලට අනුකූලව සත්‍ය හා සාධාරණ දැක්මක් ලබාදෙන මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම සඳහා මෙන්ම වංචාවකින් හෝ වැරදීමකින් සිදුවිය හැකි අතිශයින් සාවද්‍ය ප්‍රකාශවලින් තොර මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමට හැකි වනු පිණිස කළමනාකාරිත්වය විසින් නිර්ණය කරනු ලබන එවැනි යම් අභ්‍යන්තර පාලනයක් සඳහා කළමනාකාරිත්වය වග කිව යුතු වේ.

මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී, අදාල වන පරිදි ක්‍රියාකාරීභාවයට බලපාන කරුණු හෙළිදරව් කරමින් ක්‍රියාකාරී ආයතනයක් ලෙස පවත්වාගෙන යාමට සමාගම සතු හැකියාව හා සමාගම ඈවර කිරීමට හෝ මෙහෙයුම් නතර කිරීමට සමාගම අපේක්ෂා කරන්නේ නම් හෝ වෙනත් යථාර්ථවාදී විකල්පයක් නොමැතිකම හේතුවෙන් එසේ සිදු කිරීමට වන අවස්ථාවකදී හැර එම පදනම පිළිබඳව ඇගයීමට කළමනාකාරිත්වය වග කිව යුතු වේ.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පිළිබඳ විමසිලිමත් වීම පාලනයට වගකිව යුතු පුද්ගලයෝ වග කිව යුතු වෙති.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය පරිදි, සමාගමේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමට හැකි වනු පිණිස, සමාගම විසින් සිය ආදායම්, වියදම්, වත්කම් හා වගකීම් පිළිබඳ විධිමත්ව පොත් හා වාර්තා පවත්වාගෙන යාම අත්‍යවශ්‍ය වේ.

1.5 මූල්‍ය ප්‍රකාශ විගණනය කිරීම සඳහා විගණකාධිපතිවරයාගේ වගකීම

සමස්තයක් ලෙස වංචාවකින් හෝ වැරදීමකින් සිදු විය හැකි අතිශයින් සාවද්‍ය ප්‍රකාශවලින් තොර මූල්‍ය ප්‍රකාශ පිළිබඳ නැවත තහවුරු කරගැනීමක් ලබාගැනීම හා මගේ මතය අන්තර්ගත වන විගණන වාර්තාවක් ඉදිරිපත් කිරීම මගේ අරමුණය. සාධාරණ තහවුරු කරගැනීමක් යනු ඉහළ පෙලේ තහවුරු කරගැනීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්වලට අනුව සිදු කරන විගණනයක් මගින් පවත්නා අතිශයින් සාවද්‍ය ප්‍රකාශයක් සෑමවිටම හසුකරගන්නා බවට සහතික නොකරයි. වංචාවකින් හෝ වැරදීමකින් සාවද්‍ය ප්‍රකාශ පැන නැගිය හැකි අතර, තනි තනිව හෝ සාමූහිකව මෙම මූල්‍ය ප්‍රකාශ මත පදනම්ව භාවිත කරන්නන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි ඔවුන්ට සාධාරණ ලෙස බලපෑම් කළ හැකි වන්නේ නම්, වැදගත් ලෙස සලකනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්වලට අනුකූලව සිදු කරන ලද විගණනයේ කොටසක් ලෙස විගණනය පුරාවටම වෘත්තීය තීන්දුගැනීම හා සැකසහිතභාවයෙන් කටයුතු කිරීම සිදු කරමි. එමෙන්ම:

- වංචාවකින් හෝ වැරදීමකින් හෝ මූල්‍ය ප්‍රකාශවල සිදුවිය හැකි සාවද්‍ය ප්‍රකාශවල අවදානම හඳුනාගෙන, ඇගයීම, එකී අවදානම්වලට ප්‍රතිචාරී ලෙස විගණන ක්‍රමවේද සැලසුම් කර, ක්‍රියාත්මක කිරීම හා මගේ මතයට පදනමක් සැපයෙන පරිදි ප්‍රමාණවත් හා යෝග්‍ය විගණන සාක්ෂි ලබාගැනීම සිදු කරමි. වැරදීමකින් හටගන්නා අතිශයින් සාවද්‍ය ප්‍රකාශයකට වඩා වංචාවකින් සිදුවන සාවද්‍ය ප්‍රකාශයක් හඳුනානොගැනීමේ අවදානම ඉහළ මට්ටමක පවතින්නේ වංචාව තුල කුමන්ත්‍රණය, ව්‍යාජය, අභ්‍යන්තර මගහැරීම්, සාවද්‍ය නියෝජනය කිරීම් හෝ අභ්‍යන්තර පාලනයන් අභිබවායාම් ඇතුලත් විය හැකි හෙයිනි.
- සමාගමේ අභ්‍යන්තර පාලනයේ ඵලදායීතාව පිළිබඳ මතයක් පල කිරීමේ අරමුණින් නොව අවස්ථානුකූලව යෝග්‍ය පරිදි විගණන ක්‍රමවේද සැලසුම් කිරීමේ අරමුණින්, විගණනයට අදාල අභ්‍යන්තර පාලනයන් පිළිබඳ අවබෝධයක් ලබා ගන්නෙමි.
- භාවිත කරන ලද විගණන ප්‍රතිපත්තිවල යෝග්‍යතාව, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකාරිත්වය විසින් සිදු කරන ලද අදාල අනාවරණය කිරීම් පිළිබඳව ඇගයීමක් සිදු කරමි.
- ක්‍රියාකාරී ආයතනයක් ලෙස සමාගම පවත්වාගෙන යාමේ හැකියාව පිළිබඳව සුවිශේෂී සැකයක් ඇති කළ හැකි අවස්ථාවකට හෝ කොන්දේසියකට අදාල අතිශයින් අස්ථාවර තත්ත්වයක් පවතින්නේද යන්න පිළිබඳව ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව හා කළමනාකාරිත්වය විසින් ක්‍රියාකාරීභාවය පිළිබඳ ගිණුම්කරණ පදනම භාවිත කිරීමේ යෝග්‍යතාව පිළිබඳ අවසන් නිගමනය ඉදිරිපත් කරමි. අතිශයින් අස්ථාවර තත්ත්වයක් පවතින බවට මම නිගමනය කරන්නේ නම්, විගණන වාර්තාව ආශ්‍රිත අනාවරණය කිරීම් කෙරෙහි අවධානය යොමු කිරීමට හා එවැනි අනාවරණය කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් එම මතය වෙනස් කිරීමට බැඳී සිටිමි. මගේ විගණන වාර්තාවේ දිනට ලබාගත් විගණන

සාක්ෂි මත මගේ නිගමන පදනම් වේ. එසේ වුවද, අනාගත සිදුවීම් හා තත්ත්වයන් මගින් ආයතනයට ඉදිරියේදී ක්‍රියාකාරී නොවීමට හේතු සාධක මතු විය හැකිය.

- අනාවරණය කිරීම් ඇතුලු මූල්‍ය ප්‍රකාශවල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය මෙන්ම මූල්‍ය ප්‍රකාශ මගින් සාධාරණ ඉදිරිපත් කිරීමක් සිදු කළ හැකි ආකාරයේ මූලික සිදුවීම් හා ගණුදෙණු නියෝජනය කරන්නේද යන්න පිළිබඳව ඇගයීමක් සිදු කරමි.

විගණනය අතරවාරයේදී මා හඳුනාගත් වෙනත් කරුණු අතර, අභ්‍යන්තර පාලනය තුල පවත්නා යම් සුවිශේෂී ඌණතා ඇතුලුව විශේෂ විගණන සොයාගැනීම් සම්බන්ධයෙන් පාලන කටයුතුවලට අදාල පුද්ගලයින් සමඟ සන්නිවේදනය කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 පහත සඳහන් අවශ්‍යතා සඳහා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ හා 2007 අංක 7 දරන සමාගම් පනතේ නිශ්චිත විධිවිධාන ඇතුලත් වේ.

2.1.1 විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු හා විස්තර කිරීම් මා විසින් ලබාගෙන ඇති අතර, මගේ විමර්ෂනයෙන් පෙනී යන පරිදි, 2007 අංක 7 දරන සමාගම් පනතේ 163(2) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තිය මගින් දක්වා ඇති අවශ්‍යතාව පරිදි සමාගම විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන ගොස් ඇත.

2.2 වැදගත් සේ සැලකෙන කරුණුවලට සීමා වූ සාක්ෂි හා අනුගමනය කරන ලද ක්‍රමවේද හැර,

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ අවශ්‍යතාව පරිදි සාමාන්‍ය ක්‍රමවේදයෙන් බැහැරව සමාගමේ පාලන තන්ත්‍රයේ යම් සාමාජිකයෙකු සමාගම විසින් එළඹී යම් ගිවිසුමක සෘජු හෝ වක්‍රාකාරයෙන් උනන්දුවක් දක්වන බව සඳහන් කිරීමට;

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ අවශ්‍යතාව පරිදි අදාල යම් ලිඛිත නීතියකට හා සමාගමේ පාලන තන්ත්‍රය මගින් නිකුත් කරන ලද යම් සාමාන්‍ය හෝ විශේෂ මගපෙන්වීමකට අනුගතව සමාගම කටයුතු කර නොමැති බව සඳහන් කිරීමට;

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ අවශ්‍යතාව පරිදි සිය බලතල, කර්තව්‍යයන් හා රාජකාරිවලට අනුව සමාගම කටයුතු කර නොමැති බව සඳහන් කිරීමට;

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ අවශ්‍යතාව පරිදි අදාල නීතිවලට අනුගතව සහ කාලරාමු තුල සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, ඵලදායී හා කාර්යක්ෂම ලෙස ප්‍රසම්පාදනය කර, භාවිත කර නොමැති බව සඳහන් කිරීමට;

අන් කිසිදු කරුණක් මගේ අවධානයට යොමු වී නැත.

2.5 වෙනත් කරුණු

(අ) ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් බයෝටෙක්නොලොජි උද්‍යානය තුල අභ්‍යන්තර ජලනල එලීමේ අරමුණින් සමාගම විසින් ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය වෙත රු.12,600,000ක මුදලක් ගෙවා ඇත. එසේ වුවද, නාගරික සංවර්ධන අධිකාරිය විසින් මෙම සමාගම වෙත මෙම ඉඩමේ අයිතිය මාරු කර නොමැති හෙයින් 2022 මැයි මාසයේ විගණන දිනය දක්වාම එම අභ්‍යන්තර ජලනල එලීමේ වැඩ කටයුතු සිදු කර නොමැත.

(ආ) 2021 සැප්තැම්බර් සිට 2022 අගෝස්තු දක්වා කාලසීමාව තුල විද්‍යාගාරයක් පවත්වාගෙන යාම සඳහා ශ්‍රී ලංකා නිනිති තාක්ෂණ ආයතනය වෙත කල්බදු ලබා දී ඇති ගොඩනැගිල්ල සඳහා සමාගම විසින් එම ආයතනය වෙත රු.37,171,800ක මුදලක් ලබා දී ඇත. එහෙත්, 2022 මැයි මාසයේ විගණන දිනය දක්වාම එම විද්‍යාගාරය ඉදි කිරීමේ කටයුතු අවසන් කර නොමැත.

ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න
විගණකාධිපති

වාර්ෂික වාර්තාවට අදාල වන කාල සීමාව සඳහා ඉදිරිපත් වී ඇති විගණන විමසුම් මගින් පෙන්වා දී ඇති කරුණු නිවැරදි කිරීම සඳහා අදාළ ආයතනයේ කළමනාකාරීත්වය හා එහි අධ්‍යක්ෂ මණ්ඩලය / පාලක මණ්ඩලය විසින් ගනු ලැබූ ඇති සහ ඉදිරියේදී ගැනීමට අපේක්ෂිත ක්‍රියා මාර්ග.

		ක්‍රියාත්මක කිරීම
1.4 මූල්‍ය ප්‍රකාශන	1.4.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල නොවීම	2022 ට අදාලව වත්කම් ගණනය කිරීමට කටයුතු සම්පාදනය කරමින් සිටින අතර, ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කරනු ලබන්නාක් සේම, ප්‍රමිතියට අනුගතව ක්ෂයවීම් ගණනය කිරීම නිවැරදි කර ඇත.
3 මෙහෙයුම් සමාලෝචනය	3.1 කළමණාකරණ අකාර්යක්ෂමතා	(අ) අදාළ භාණ්ඩ ලේඛනගත කර ඇති අතර, භාණ්ඩ ලේඛනයේ මෘදු පිටපතක් පවත්වාගෙන යමින් ඇත. බඳවාගැනීමේ ක්‍රමවේදය නිසියාකාරව සකස් කර, විධිමත් ලෙස අනුමත කර ඇත. (ආ) බඳවාගැනීමේ ක්‍රමවේදය නිසියාකාරව සකස් කර, විධිමත් ලෙස අනුමත කර ඇත.
	3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා	(අ) නිර්දේශ සමඟ අනුගතව කටයුතු කරන ලෙස උපදෙස් ලබා දී ඇත. (ආ) කොවිඩ් වසංගතය මධ්‍යයේ වුවද, සියලු පර්යේෂණාගාර සඳහා අවශ්‍ය සැලසුම් සකස් කර ඇති අතර, ඒ සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන වෙන්කිරීම් වෙනුවෙන් ඉල්ලීම් සිදු කර ඇත. එමෙන්ම, අරගලය සමයේදී ඉන්ධන හිඟතාව හේතුවෙන් මාස 02ක කෙටි කාලසීමාවක් තුල මෙම ආයතනය අමාත්‍යාංශ 8ක් වෙත මාරු කිරීම නොසලකමින්, 2021 මාර්තු මාසයේ සිට පළමු ව්‍යාපෘතිය (ජෛව සංරක්ෂණාගාරය) සඳහා සෙල්සියස් -80ක අධිශීතකරණයක් ලබාදී, කොවිඩ් සංරක්ෂණාගාරයක් තුල පවත්වාගෙන යන ලදී. මෙම ආයතනය සඳහා උපකරණ ලබාගැනීම සඳහා HSEP ව්‍යාපෘතිය මගින් සියලු කටයුතු සිදු කර ඇත

	3.3 මානව සම්පත් කළමණාකරණය	(අ) අනුමත කරන ලද බඳවාගැනීමේ ක්‍රමවේදයට අනුකූලව කාර්යසාධනය මත පදනම්ව ඉදිරි සියලුම බඳවාගැනීම් සිදු කරන ලෙස නියම කර ඇත. ශ්‍රී ලංකාවට විදේශ විනිමය රැගෙන ඒම සඳහා විද්‍යාඥයින් විසින් පර්යේෂණ ව්‍යාපෘති 10ක් ඉදිරිපත් කර ඇති අතර, අපි වෙනත් පර්යේෂණාගාරයක් තුළ විද්‍යාගාර කටයුතු සිදු කර ඇත්තෙමු.
		(ආ) අනුමත කරන ලද අතුරු අයවැය වාර්තාවේ සඳහන් ඉඩම සඳහා අරමුදල් වෙන් කර ඇති අතර, එය නිදහස් කිරීමෙන් අනතුරුව, වැඩිදුර සංවර්ධනය කිරීම සඳහා සැලසුම් සකස් කරමින් පවතී. මේ සඳහා අවශ්‍ය සියලුම මූලික සැලසුම් අවසන් කර ඇති අතර, විදුලිය, ජලය හා මහාමාර්ග සඳහා අවශ්‍ය සියලුම මූලික වැඩ කටයුතු අවසන් කර ඇත.
		(ඇ) 2022 වර්ෂයේ පර්යේෂණාගාර උපකරණ ලැබීමත් සමඟම එම වර්ෂයේ මෙහෙයුම් ආරම්භ කිරීමට සැලසුම් කර ඇත.
		(ඈ) භාණ්ඩාගාරය නියෝජනය කරමින් අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝජිතයින් 3දෙනෙකු සිටින අතර, නිවැරදි කරන ලද මණ්ඩල අනුමැතිය මීට යා කර ඇත.
4. වගවීම හා යහපාලනය	4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම	(අ) නිර්දේශවලට අනුව 2023 ක්‍රියාකාරී සැලසුම සකස් කිරීමට පියවර ගෙන ඇත
		(ආ) අයවැය ඇස්තමේන්තුව අනුව 2023 ක්‍රියාකාරී සැලසුම සකස් කිරීමට යොමු කොට ඇත.
		(ඇ) නිර්දේශවලට අනුකූල සැලසුම් සකස් කිරීමට උපදෙස් ලබා දී ඇත.

විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

2021 දෙසැම්බර් 31 න් අවසන් වන මාස දා හතරක කාල සීමාව සඳහා

	සටහන්	රු. ශත.
ආදායම	(3)	-
සෘජු පිරිවැය		(23,002,061.84)
වෙනත් මෙහෙයුම් ආදායම	(4)	240,000.00
පරිපාලන වියදම්		(27,455,239.51)
මෙහෙයුම් ලාභය /(පාඩුව)	(5)	(50,217,301.36)
මූල්‍ය වියදම්	(6)	(5,469.99)
බදුකරණයට පෙර ශුද්ධ ලාභය/(පාඩුව)		(50,222,771.35)
බදුකරණය	(7)	-
බදුකරණයට පසු ශුද්ධ ලාභය/(පාඩුව)		**(50,222,771.35)**
වෙනත් විස්තීර්ණ ආදායම්		
වෙනත් විස්තීර්ණ ආදායම්වල අංග		-
බදුවලින් නිදහස් මුළු ශුද්ධ විස්තීරණ ආදායම්		**(50,222,771.35)**

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

2021 දෙසැම්බර් 31 දිනට

වත්කම්	සටහන්	රු. ශත.
ජංගම නොවන වත්කම්		
දේපල, පිරියත හා උපකරණ	(8)	5,542,541.09
ක්‍රියාත්මක ප්‍රාග්ධන කාර්යයන්	(9)	44,500.00
		5,587,041.09
ජංගම වත්කම්	(10)	
ලැබිය යුතු හා ගෙවන ලද අත්තිකාරම්	(11)	54,019,353.51
මුදල් හා මුදල් සමානයන්		4,686,755.49
		58,706,109.00
මුළු වත්කම්		**64,293,150.10**
ස්කන්ධය හා වගකීම්		
ස්කන්ධය		
ප්‍රකාශිත ප්‍රාග්ධනය	(13)	10.00
කොටස් වෙන්කිරීම වෙනුවෙන් අරමුදල්		113,499,990.00
රඳවාගෙන ඇති ඉපැයීම්		(50,222,771.35)
		63,277,228.65
ජංගම වගකීම්		
වෙළඳාම් හා වෙනත් ගෙවිය යුතු	(13)	1,015,921.45
මුළු ස්කන්ධ හා වගකීම්		**64,293,150.10**

මෙම මූල්‍ය ප්‍රකාශ 2007 අංක 07 දරන සමාගම් පනතේ අවශ්‍යතාවලට අනුකූල වේ.

මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කර, ඉදිරිපත් කිරීම වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වග කිව යුතු වේ.

ස්කන්ධය වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස දාහතරක කාලසීමාව සඳහා

	ප්‍රකාශිත ප්‍රාග්ධනය	කොටස් වෙන්කිරීම වෙනුවෙන් අරමුදල්	රඳවාගෙන ඇති ඉපැයීම්	මුළු
	රු. ශත.	රු. ශත.	රු. ශත.	රු. ශත.
කොටස් නිකුත් කිරීම	10.00	-	-	10.00
ලද අරමුදල්	-	113,499,990.00	-	113,499,990.00
කාලසීමාව සඳහා පාඩුව	-	-	(50,222,771.35)	(50,222,771.35)
වෙනත් විස්තීර්ණ ආදායම්	-	-	-	-
2020 මාර්තු 31 දිනට ශේෂය	**10.00**	**113,499,990.00**	**(50,222,771.35)**	**63,277,228.65**

මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස දාහතරක කාලසීමාව සඳහා

	රු.
මෙහෙයුම් කටයුතුවලදී ලද/(භාවිත වූ) මුදල් ප්‍රවාහ	
ආදායම් බදුකරණයට පෙර මෙහෙයුම් පාඩුව	(50,222,771)
ගැළපුම්	
ක්ෂය වීම	313,826
කාරක ප්‍රාග්ධන වෙනස්කම්	
ලැබිය යුතු හා ගෙවන ලද අත්තිකාරම්හි (වැඩිවීම)/අඩුවීම	(54,019,354)
වෙළඳ හා වෙනත් ගෙවිය යුතු අයිතමයන්හි වැඩිවීම/(අඩුවීම)	1,015,921
කාරක ප්‍රාග්ධන වෙනස්කම්වලට පෙර මෙහෙයුම් ලාභය/(පාඩුව)	(102,912,377)
මෙහෙයුම් කටයුතුවලදී ලද/(භාවිත වූ) ශුද්ධ මුදල් ප්‍රවාහ	(102,912,377)
ආයෝජන කටයුතුවලදී ලද/(භාවිත වූ) මුදල් ප්‍රවාහ	
ඉඩම් සංවර්ධන පිරිවැය	(44,500)
ස්ථාවර වත්කම් අත්පත් කරගැනීම	(5,856,367)
ආයෝජන කටයුතුවලදී ලද/(භාවිත වූ) ශුද්ධ මුදල් ප්‍රවාහ	(5,900,867)
මූල්‍ය කටයුතුවලදී ලද/(භාවිත වූ) මුදල් ප්‍රවාහ	
කොටස් සඳහා ලද ලැබීම්	113,500,000
මූල්‍ය කටයුතුවලදී ලද/(භාවිත වූ) ශුද්ධ මුදල් ප්‍රවාහ	113,500,000
මුදල් හා මුදල් සමානයන්හි ශුද්ධ වැඩිවීම/(අඩුවීම)	4,686,755
වසර මුලදී මුදල් හා මුදල් සමානයන්	-
වසර අගදී මුදල් හා මුදල් සමානයන්	**4,686,755**
මුදල් හා මුදල් සමානයන්හි විශ්ලේෂණය	
බැංකු ගිණුම - මහජන බැංකුව	4,650,140
අතැති මුදල්	36,616
	4,686,755

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස දාහතරක කාලසීමාව සඳහා

1. ආයතනික තොරතුරු

1.1 වාර්තා කිරීමේ ආයතනය

සී/ස ශ්‍රී ලංකා ජෛවතාක්ෂණ පුද්ගලික ආයතනය රජය සතු සමාගමක් වශයෙන් භාණ්ඩාගාරයේ ලේකම් එහි පරම කොටස්හිමියා බවට පත්කරමින් 2020 ඔක්තෝබර් 12වන දින සංස්ථාපනය කරන ලද මෙරට පිහිටි සීමිත වගකීමක් සහිත සමාගමකි. මෙම සමාගම 2020 දෙසැම්බර් 11වන දින තාක්ෂණවේද අමාත්‍යාංශය යටතේද ඉන් අනතුරුව, ඩිජිටල් තාක්ෂණවේද හා ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය යටතේද ගැසට් කරන ලදී. සමාගමේ ලියාපදිංචි කාර්යාලය කොළඹ 01, මහලේකම් කාර්යාලය, මුදල් අමාත්‍යාංශයේ පිහිටා ඇත.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් හා මෙහෙයුම්හි ස්වභාවය

සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම වන්නේ අගයන් නිර්මාණය කිරීම, දේශීය හරයන් හා ගෝලීය ප්‍රවේශයන් සහිත ජාතියක් උදෙසා ඉල්ලුමක් සහිත ජෛවතාක්ෂණික නවෝත්පාදන හා නිෂ්පාදන පරිසර පද්ධතියක් සඳහා පහසුකම් සපයා, සහාය ලබා දී, පවත්වාගෙන යාමයි.

1.3 මූල්‍ය ප්‍රකාශ අනුමත කිරීම

2022 පෙබරවාරි 24වන දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට අනුව, 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස දාහතරක කාලසීමාව සඳහා සී/ස ශ්‍රී ලංකා ජෛවතාක්ෂණ පුද්ගලික ආයතනයේ මූල්‍ය ප්‍රකාශ මුද්‍රා හැරීමට බලය හිමි විය.

1.4 අනුකූලතාව පිළිබඳ ප්‍රකාශය

ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කර ඇති සමාගමේ මූල්‍ය ප්‍රකාශ, ශ්‍රී ලංකා මූල්‍ය රෙගුලාසි හා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ සංගමය විසින් නිකුත් කර ඇති ගිණුම්කරණ ප්‍රමිතීන් ඇතුලත් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්වලට අනුව සකස් කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම හා ඉදිරිපත් කිරීම 2007 අංක 7 දරන සමාගම් පනතට අනුකූල වේ.

2. සකස් කිරීමේ පදනම සහ සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය

2.1 සකස් කිරීමේ පදනම
උපචිත පදනමක් මත සහ ඓතිහසික පිරිවැය සම්මුතිය යටතේ මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කර ඇත.

2.1.1 පවත්වාගෙන යාම
සමාගම පවත්වාගෙන යාමේ හැකියාව පිළිබඳව අධ්‍යක්ෂවරුන් විසින් ඇගයීමක් සිදු කර ඇති අතර, ඔවුහු සමාගම ඈවර කිරීමට හෝ වෙළඳ කටයුතු නතර කිරීමට හෝ අපේක්ෂා නොකරති.

2.1.2 සංසන්දනාත්මක තොරතුරු
මෙය සමාගමේ මෙහෙයුම්හි පළමු කාලසීමාව වන හෙයින් සංසන්දනාත්මක තොරතුරු මෙම මූල්‍ය ප්‍රකාශ තුල ඉදිරිපත් කර නැත.

2.2 සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය

2.2.1 ආදායම් හඳුනාගැනීම

ශ්‍රී ලංකා මූල්‍ය රෙගුලාසි 15 යටතේ යම් වගකීමක් සාධනය කිරීම තෘප්ත කිරීම මත ආදායම් හඳුනාගැනේ. ගිවිසුම්ගතව අර්ථනිරූපිත ගෙවීම් නියමයන් සැලකිල්ලට ගනිමින් හා බදු හෝ තීරු බදු බැහැර කරමින්, ලද හෝ ලැබිය යුතු මුදලක සාධාරණ අගය මත ආදායම් ගණනය කෙරේ.

(අ) පොලිය

ඵලදායී පොලී අනුපාත (EIR) ක්‍රමවේදය යොදාගනිමින් පොලී ආදායම් හඳුනාගැනේ.

(ආ) ලැබීම් සහ පාඩු
බැහැර කිරීම මත ලැබීම්, වත්කම්හි වටිනාකම හා ආශ්‍රිත විකුණුම් වියදම් අඩු කිරීමෙන් පසුව, දේපල, පිරියත හා උපකරණ හා ආයෝජන ඇතුලු වෙනත් ජංගම නොවන වත්කම්වල ස්වරූපය මත බැහැර කිරීම මත ආදායම්හි දළ ලැබීම් හා පාඩු විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ ගණනය කරනු ලබයි.

ප්‍රධාන ආදායම් ජනනය කරන ක්‍රියාකාරකම් සහ වැදගත් ලෙස නොසලකන එවැනිම ආකාරයේ ගණුදෙණු සමූහයකින් ජනනය වන ක්‍රියාකාරකම්වලට අදාල ලැබීම් හා පාඩු දළ පදනමක් මත එකරැස්කර, වාර්තා කර, ඉදිරිපත් කරනු ලබයි.

(ඇ) වෙනත්
වෙනත් ආදායම් උපචිත පදනමක් මත හඳුනාගැනේ.

2.2.2 වියදම් හඳුනාගැනීම

(අ) හටගත් පිරිවැය හා විශේෂිත ආදායම් අයිතමයන්ගේ ඉපැයීම් අතර සෘජු සම්බන්ධතාවක පදනමක් මත විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුල වියදම් හඳුනාගැනේ. ව්‍යාපාරය, දේපල, පිරියත හා උපකරණ කාර්යක්ෂම මට්ටමින් පවත්වාගෙනයාමේදී හටගන්නා සියලුම වියදම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට ඇතුලත් කෙරේ.

(ආ) විස්තීර්ණ ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීම පිණිස, "වියදම්හි කාර්යයන්" ක්‍රමවේදය මගින් සමාගමේ කාර්යසාධනය හා සම්බන්ධ කරුණු සාධාරණ ලෙස ඉදිරිපත් කරනු ලබන බව අධ්‍යක්ෂවරුන්ගේ මතය වන අතර, එම නිසා එම ඉදිරිපත් කිරීමේ ක්‍රමවේදය අදාල කරගනු ලබයි.

(ඇ) ණයට ගැනීමේ පිරිවැය
ණයට ගැනීමේ පිරිවැය අපේක්ෂිත භාවිතය උදෙසා සූදානම් කරනු ලබන තෙක් සැලකිය යුතු කාලසීමාවක් ලබාගන්නා වත්කමක් අත්පත්කරගැනීම, ඉදිකිරීම හෝ නිපදවීම හෝ අදාල වත්කමේ පිරිවැයේ කොටසක් ලෙස අලෙවිය ප්‍රාග්ධනීකරණය කරනු ලැබීම උදෙසා සෘජුවම අදාල වේ. අනෙකුත් සියලුම ණයට ගැනීමේ පිරිවැය එම වියදම් හටගත් කාලසීමාව තුල වියදමක් සේ හඳුනාගැනේ.

2.2.3 විදේශ විනිමය පරිවර්තනය කිරීම

සියලුම විදේශ විනිමය ගණුදෙණු, එම ගණුදෙණු සිදු කරන කාලසීමාවේදී පවත්නා හුවමාරු අනුපාතයන්වලට වාර්තා කිරීමේ විනිමය අගය වන ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කරනු ලබයි.

වසර අවසානයේ විදේශ විනිමය අනුපාතයන් භාවිත කරමින්, විදේශ විනිමයන්ගෙන් සමන්විත මුදල් වත්කම් හා වගකීම් ශ්‍රී ලංකා රුපියල් සමානයන්ට පරිවර්තනය කරනු ලැබේ.

අගයන් නිර්ණය කරන ලද අවස්ථාවේදී පැවති හුවමාරු අනුපාතයන් භාවිත කරමින් මුදල් නොවන වත්කම් හා වගකීම් පරිවර්තනය කරනු ලබයි. එමගින් ජනනය වන ලාභ සහ පාඩු ලාභාලාභ ගිණුමේ ගිණුම්ගත කරනු ලබයි.

2.2.4 බදුකරණය

(අ) වත්මන් බදු
මූල්‍ය ප්‍රකාශවල වාර්තා කර ඇති පරිදි ආදායම් හා වියදම් සංරචක මත දේශීය ආදායම් සඳහා ප්‍රතිපාදන පදනම් වන අතර, දේශීය ආදායම් බදු පනතේ විධිවිධානවලට අනුව ගණනය කෙරේ.

(ආ) කල්තබන ලද බදු
වාර්තා කරනු ලබන දිනයේදී වත්කම් හා වගකීම්වල බදු පදනම හා මූල්‍ය වාර්තා කිරීමේ කාර්යයන් සඳහා එමගින් රැගෙන යන අගයන් අතර තාවකාලික වෙනස මත වගකීම් ක්‍රමවේදය භාවිත කරමින් කල්තබන ලද බදු ලබා දෙයි.

2.2.5 දේපල, පිරියත හා උපකරණ

(අ) පිරිවැය
සමුච්චිත ක්ෂයකිරීම් සහ සමුච්චිත අගය හානිවීම් අඩුකරන ලද පිරිවැය මත දේපල, පිරියත හා උපකරණ සඳහන් කෙරේ.

(ආ) දේපල, පිරියත හා උපකරණ හානිවීම්
දේපල, පිරියත හා උපකරණවල අගයන් වාර්ෂිකව හානිවීම් හෝ අවස්ථාවන් හෝ අවස්ථා වෙනස් වීමක් මගින් එම අගයන් නැවත අයකරගත නොහැකි බව දැක්වෙන විටකදී දේපල, පිරියත හා උපකරණවල අගයන් නැවත සමාලෝචනය කෙරේ. එවැනි යම් සලකුණක් ඇත්නම් හා එම අගයන් ඇස්තමේන්තුගත අයකරගත හැකි මුදල ඉක්මවා යන්නේ නම්, එම වත්කම් එහි අයකරගතහැකි අගයන්වලට ගණනය කරනු ලබයි. එකී වත්කම සඳහාම පැවැති පෙර නැවත තක්සේරු කිරීමේ අතිරික්තය නැවත හරවන්නේ නම් හැර, හානිවීම් පාඩු ආදායම් ප්‍රකාශය තුල හඳුනාගැනේ.

(ඇ) එදිනෙදා පිරිවැය
යම් කොටසකට අනුබද්ධිත අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගම වෙත ලැබෙන බවට හා එහි පිරිවැය විශ්වාසනීය ලෙස ගණනය කළ හැකි බවට හැඟී යන්නේ නම් දේපලක, පිරියතක හා උපකරණයක යම් අයිතමයක් සතු යම් අංගයක් ආදේශ කිරීමේ පිරිවැය එම අයිතමය දරන වටිනාකම තුළ හඳුනාගැනේ. ආදේශ කරන ලද කොටස දරන වටිනාකම හඳුනාගැනීමෙන් බැහැර කෙරේ.

එදිනෙදා දේපල, පිරියත හා උපකරණ අලුත්කිරීමේ පිරිවැය හටගත් ලාභාලාභ තුල හඳුනාගැනේ.

(ඈ) ක්ෂයකිරීම්
සෘජු රේඛීය පදනමක් යොදාගනිමින් සියලු දේපල, පිරියත හා උපකරණවල පිරිවැය මත ක්ෂයකිරීම් සඳහා ප්‍රතිපාදන ගණනය කරනු ලබයි. ඇස්තමේන්තුගත ආයුකාලය මත එවැනි වටිනාකම් ඉවත්කර දැමීම සඳහා යොදාගනු ලබන ප්‍රධාන වාර්ෂික කාලසීමාවන් වන්නේ:

වසර 03කට වැඩි පරිගණක හා ආශ්‍රිත උපකරණ.

වත්කම් භාවිතයට ගත හැකි දිනයේ සිට බැහැර කරනු ලබන දිනය දක්වා මූල්‍ය ප්‍රකාශ තුල ක්ෂය කිරීම් පෙන්වා දී ඇත.

(ඇ) ක්‍රියාත්මකභාවයේ පවතින ප්‍රාග්ධන කාර්යයන්
ක්‍රියාත්මකභාවයේ පවතින ප්‍රාග්ධන කාර්යයන් පිරිවැයෙහි සටහන් කෙරේ. මෙම වියදම් සෘජුවම ගොඩනැඟිලි ඉදිකිරීම සඳහා වෙන්වන ප්‍රාග්ධන ස්වරූපයේ වියදම් වේ. ඉදිකිරීම් කාලසීමාවේදී ප්‍රාග්ධන ස්වරූපයේ වියදම් ක්‍රියාත්මකභාවයේ පවතින ප්‍රාග්ධන කාර්යයන් වෙනුවෙන් ගිණුම්ගත කෙරේ.

2.2.6 මූල්‍ය උපකරණ

මූල්‍ය වත්කම්

හඳුනාගැනීම හා මූලික මිනුම් සිදු කිරීම

මූලික හඳුනාගැනීමේදී වෙනත් විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ අගයට (FVOCI) නියම කරන ලද ආයෝජන සහ අරමුණ, ලක්ෂණ හා මූල්‍ය වත්කම් අත්පත්කරගැනීමට කළමනාකාරීත්වයට ඇති අරමුණ මත පදනම් වූ ක්‍රමක්ෂය කරන ලද පිරිවැය ලෙස සමාගම විසින් මූල්‍ය වත්කම් වර්ගීකරණය කරනු ලබයි. සෑම වාර්තා කිරීමේ කාලසීමාවක් අවසානයේම එවැනි වර්ගීකරණයක් අවශ්‍ය වන හා අනුමත කරනු ලබන මට්ටම දක්වා සියලුම වර්ගීකරණයන් නැවත ඇගයීම සිදු කරනු ලැබේ. ලැබිය යුතු ආදායම් හා නිකුත් කරන ලද ණය සුරැකුම් උත්පන්න වන විට මූලික වශයෙන් හඳුනාගැනේ. සමාගම යම් මූල්‍ය උපකරණයක ගිවිසුම්ගත විධිවිධානවලට පාර්ශ්වයක් වන විට අනෙකුත් සියලුම මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් මූලික වශයෙන් හඳුනාගැනේ. යම් මූල්‍ය වත්කමක් (එය සුවිශේෂී මූල්‍යකරණ අංගයක් රහිත ලැබිය යුතු වෙළඳ අගයක් වන්නේ නම් හැර) හෝ මූල්‍ය

වගකීමක් එය අත්පත්කරගැනීමට සෘජුව දායක වන සාධාරණ අගයද ඇතුළු ගණුදෙණු පිරිවැය මත මූලිකව ගණනය කිරීම සිදු කරයි.

වර්ගීකරණය කිරීම සහ ගණනය කිරීම

ව්‍යාපාරික ආකෘතිය ඇගයීම
ව්‍යාපාරය කළමනාකරණය කරනු ලබන ආකාරය පිළිඹිබු වන හෙයින් හා කළමනාකාරිත්වයට තොරතුරු ලබා දෙන හෙයින් සමාගම විසින් උපායමාර්ගික මට්ටමින් පවත්වාගෙන යන මූල්‍ය වත්කමක් ඇතුලත් වන ව්‍යාපාරික ආකෘතියක අරමුණ පිළිබඳ ඇගයීමක් සිදු කරනු ලබයි. එලෙස සලකා බලනු ලබන තොරතුරුවල ඇතුලත් වන්නේ:

- උපායමාර්ගික මට්ටමින් පවත්වාගෙන යන මූල්‍ය වත්කම් ඇගයීම සිදු කර, සමාගමේ කළමනාකාරීත්වයට වාර්තා කරන ආකාරය;

- පෙර කාලවලදී මූල්‍ය වත්කම් අලෙවියේ ශීඝ්‍රතාව, ප්‍රමාණය හා කාලසීමාවන්, එවැනි අලෙවියක් සඳහා හේතු හා අනාගත අලෙවි කටයුතු පිළිබඳ අපේක්ෂාවන්.

ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ පරම වශයෙන් ප්‍රධාන හා පොලී ගෙවීම් සඳහාද යන්න ඇගයීම

මෙම ඇගයීම පිණිස, ‘ප්‍රධාන’ යන්න මූලික හඳුනාගැනීම මත මූල්‍ය වත්කමක සාධාරණ වටිනාකම ලෙස අර්ථනිරූපණය කර ඇත. ‘පොලිය’ යන්නෙන් මුදලේ කාලීන අගය සඳහා සහ යම් නිශ්චිත කාලසීමාවක් තුල ප්‍රධාන හිඟ මුදල හා සම්බන්ධ ණය අවදානම මෙන්ම වෙනත් මූලික ණයදීමේ අවදානම්සහගත තත්ත්වයන් සඳහා මුදලක් ලෙස හා ලාභ ආන්තිකයක් ලෙස ද අර්ථනිරූපණය කෙරේ. ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ප්‍රධාන හා පොලී ගෙවීම් සඳහා පමණක්ම සිදුකරන්නේද යන්න ඇගයීමේදී, සමාගම විසින් මූල්‍ය උපකරණයේ ගිවිසුම්ගත නියමයන් සලකා බලනු ලබයි. මෙම කොන්දේසිය සපුරාලනු නොලබන කාලසීමාවන් හෝ ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ අගයන් වෙනස් කළ හැකි යම් ගිවිසුම්ගත නියමයක් මෙම මූල්‍ය වත්කම් තුල අන්තර්ගතවන්නේද යන්න ඇගයීම ඊට ඇතුලත් වේ.

වෙනත් විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ අගයන් මත ගණනය කරන ලද මුදල් සමානයන්හි සුරැකුම්

සමාගම විසින් මුදල් සමානයන්හි සිදු කරන ලද ආයෝජන වෙනත් විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ අගයන් ලෙස වර්ගීකරණය කර ඇත. වෙළඳාම සඳහා රඳවානොගත් යම් මුදල් සමානයන් ආයෝජනයක් මූලිකව හඳුනාගැනීම මත, සමාගම විසින් වෙනත් විස්තීර්ණ ආදායම්හි ආයෝජනවල සාධාරණ අගයෙහි ඉදිරි වෙනස්කම් ඉදිරිපත් කිරීමට සමාගම නිසැකවම තෝරාගනු ඇත. මෙම තෝරාගැනීම ආයෝජනයෙන් ආයෝජනයට පදනමක් මත සිදු කෙරේ.

මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය කරන ලද පිරිවැය

පහත සඳහන් කොන්දේසි සපුරාලන හා වෙනත් විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ අගයන් ලෙස හඳුනා නොගන්නේ නම් යම් වත්කමක් ක්‍රමක්ෂය කරන ලද පිරිවැයට ගණනය කෙරේ:

- ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එක්රැස් කිරීම සඳහා වත්කම් පවත්වාගෙන යාම අරමුණ කරගත් ව්‍යාපාරික ආකෘතියක් තුල එය පැවතීම; සහ
- එම ගිවිසුම්ගත නියමයන් නිශ්චිත දිනවලදී ප්‍රධාන හිඟ මුදල් හා ඒ මත පොලිය ගෙවීම් පමණක් වන මුදල් ප්‍රවාහ සඳහා ඉඩ ලබාදීම.

වර්ගීකරණය කරන ලද හා ක්‍රමක්ෂය කරන ලද පිරිවැයට ගණනය කරන ලද සමාගමේ මූල්‍ය වත්කම් එහි වෙළඳාමට හා වෙනත් ලැබිය යුතු ආදායම්, තැන්පතු, අදාල පාර්ශ්වයන්ගෙන් අයවිය යුතු මුදල් සහ මුදල් හා මුදල් සමිනයන්ට සීමා වේ.

මූල්‍ය වත්කම් ඉදිරියට ගණනය කිරීම

සමාගමේ මූල්‍ය වත්කම් ඉදිරියට ගණනය කිරීම පහත සඳහන් පරිදි වේ;

ක්‍රමක්ෂය කරන ලද පිරිවැයට මූල්‍ය වත්කම්

මෙම වත්කම් ඵලදායී පොලී ක්‍රමවේදය යොදාගනිමින් ක්‍රමක්ෂය කරන ලද පිරිවැයට ඉදිරියේදී ගණනය කෙරේ. මෙම ක්‍රමක්ෂය කරන ලද පිරිවැය හානි මගින් අඩු කෙරේ. පොලී ආදායම්, විදේශ විනිමය හුවමාරු ලැබීම් හා පාඩු මෙන්ම හානි ලාභාලාභ තුල හඳුනාගැනේ. හඳුනානොගත් යම් ලාභයක් හෝ පාඩුවක් ලාභාලාභ තුල හඳුනාගැනේ.

වෙනත් විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ අගයන්හි මුදල් සමානයන් ආයෝජනය කිරීම

මෙවැනි වත්කම් පසුකාලීනව සාධාරණ අගයකට ගණනය කෙරේ. ලාභාංශය මගින් ආයෝජන පිරිවැයේ යම් කොටසක් නැවත අයකරගැනීමක් නියෝජනය නොවන්නේ නම් ලාභාලාභ තුල ලාභාංශ ආදායම් සේ හඳුනා ගැනේ. වෙනත් දළ ලාභ හා පාඩු OCIහි හඳුනාගැනෙන අතර, කිසි දිනෙක ලාභාලාභවලට නැවත වර්ගීකරණය කරනුයේ නැත.

මූල්‍ය වත්කම් හඳුනාගැනීමෙන් බැහැර කිරීම

වත්කමකින් ලැබෙන මුදල් ප්‍රවාහවලට ඇති ගිවිසුම්ගත අයිතීන් කල් ඉකුත් වන විට හෝ මූල්‍ය වත්කමේ හිමිකමේ සියලු අවදානම් හා ප්‍රතිලාභ මාරු කර හරින යම් ගණුදෙණුවක ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලැබීමට ඇති අයිතිය මාරු කරන විට හෝ එම හිමිකමේ සියලු අවදානම් හා ප්‍රතිලාභ මාරු කර නොහරින හෝ රඳවා තබානොගන්නා විට හෝ මාරු කරන ලද වත්කමේ පාලනය රඳවා තබා නොගන්නා විට සමාගම යම් මූල්‍ය වත්කමක් (අවස්ථානුකූලව එහි කොටසක් හෝ) හඳුනාගැනීමෙන් බැහැර කරයි. එවැනි හඳුනාගැනීමෙන් තොරව බැහැර කරන ලද සමාගම විසින් නිර්මිත හෝ රඳවාගෙන ඇති මූල්‍ය වත්කම්හි යම් පොලියක් වෙන් වූ වත්කමක් හෝ වගකීමක් ලෙස හඳුනාගැනේ. යම් මූල්‍ය වත්කමක් හඳුනාගැනීමෙන් බැහැර කිරීම මත, එම වත්කම දරන අගය සහ (හඳුනාගැනීමෙන් බැහැර කරන ලද වත්කමක කොටසට අදාලව වෙන් කරන ලද අගය හෝ) ලද අගයේ එකතුව (ලද යම් නව වගකීමක් අඩු කළ ලබාගත් යම් නව වත්කමක් ඇතුළුව) අතර වෙනස හා වෙනත් විස්තීර්ණ ආදායම්හි හඳුනාගත් යම් සමුච්චිත ලාභයක් හෝ පාඩුවක් ලාභාලාභ තුල හඳුනාගැනේ.

මූල්‍ය වත්කම් හායනය වීම

සියලුම වෙළඳ ලැබීම් සඳහා ආයු කාලය තුල අපේක්ෂිත හානි ප්‍රතිපාදන භාවිත කිරීමට අනුමැතිය හිමි වන පරිදි ශ්‍රී ලංකා මූල්‍ය රෙගුලාසි 9ට අනුව අපේක්ෂිත ණය හානි ලබාදීම සඳහා සරල කරන ල ප්‍රවේශය මත පදනම්ව මූල්‍ය වත්කම් සඳහා සමාගම විසින් හායනය කරනු ලබයි.

අපේක්ෂිත ණය හානි ගණනය කිරීම

අපේක්ෂිත ණය හානි යනු සම්භාවිතාව මත බර තබන ලද ණය හානි ඇස්තමේන්තුවක් වන අතර, සියලු මුදල් පහළ වැටීම්හි වත්මන් අගය (ගිවිසුමට අනුව ආයතනය හේතුවෙන් හටගන්නා මුදල් ප්‍රවාහ සහ සමාගම ලැබීමට අපේක්ෂා කරන මුදල් ප්‍රවාහ අතර වෙනස) ලෙස ගණනය කෙරේ. මෙම ණය හානි සඳහා මූල්‍ය වත්කමේ ඵලදායී පොලී අනුපාතය මත වට්ටම් ලබා දේ. පෙර ප්‍රතිපත්තිය සමඟ සසඳන විට මෙමගින් හානි දීමනාවෙහි කිසිදු වැදගත් වෙනසක් සිදු කර නැත. යම් තනි වත්කමකට හෝ සාමූහික මට්ටමින් හායනය සඳහා ලැබිය හැකි සාක්ෂි සලකා බැලීම මගින් මෙම දීමනාව ලබා දෙයි. යම් පාරිභෝගිකයෙකු විසින් ගෙවීම් සිදු කිරීමේදී යම් සුවිශේෂි මූල්‍ය අපහසුතාවක් හෝ පැහැර හැරීමක් අත්විඳින්නේ නම් වැනි කරුණක් ඇතුලු විෂයානුබද්ධ සාක්ෂි සලකා බැලීම මගින් සියලු සුවිශේෂි තනි ලැබිය හැකි ආදායම් හායනය සඳහා වෙන් වෙන්ව අගයනු ලැබේ. කළමනාකාරිත්ව තීරණ මත පදනම්ව සියලු වැදගත් නොවන තනි ණයගැතියන් හා නිශ්චිත වශයෙන් හායනය නොවූ එක හා සමාන අවදානම්සහගත ලක්ෂණ දරන ණයගැතියන් ඉන් අනතුරුව හටගෙන ඇති නමුත් මෙතෙක් හඳුනාගෙන නොමැති යම් හායනයක් එක්ව සමාන අවදානම්සහගත ලක්ෂණ මත පදනම් සාමූහික වශයෙන් අගයනු ලැබේ.

මූල්‍ය වගකීම්

මූලික හඳුනාගැනීම හා ගණනය කිරීම

මූල්‍ය වගකීම් ක්‍රමක්ෂය කරන ලද පිරිවැයට හෝ ලාභාලාභ හරහා සාධාරණ අගයට ගණනය කර වර්ගීකරණය කරයි. මූලික හඳුනාගැනීමේදී වෙළඳාම සඳහා රඳවාගත් සේ වර්ගීකරණය කළහොත් යම් මූල්‍ය වගකීමක් මෙම ගණයට වර්ගීකරණය කරයි. මෙම ගණයට අයත් මූල්‍ය වගකීම් සාධාරණ අගයට ගණනය කරන අතර, යම් පොලී වියදමක් ද ඇතුලුව ජනිත වන යම් ලාභයක් හා පාඩුවක් ලාභාලාභ තුල හඳුනාගැනේ. මූලික හඳුනාගැනීමේදී සමාගම විසින් මූල්‍ය වගකීම් වෙනත් මූල්‍ය වගකීම් ලෙස

වර්ගීකරණය කරනු ලබයි. සෑම වාර්තා කරන කාලසීමාවක් අවසානයේදීම එවැනි යම් වර්ගීකරණයක් අනුමත කර අවශ්‍ය වන මට්ටමට සියලුම වර්ගීකරණයන් නැවත ඇගයීම සිදු කරනු ලබයි. සෘජුවම ගණුදෙණු පිරිවැයට අදාල යම් අගයක් අඩු කර සාධාරණ අගයකට මූලිකව සියලුම මූල්‍ය වගකීම් හඳුනාගනු ලැබේ. වෙනත් මූල්‍ය වගකීම් තුල ප්‍රධාන වශයෙන් වෙළඳාම, වෙනත් ගෙවිය යුතු අගයන් හා බැංකුවෙන් ලබාගන්නා ණය යනාදිය ඇතුලත් වේ.

ඉදිරි ගණනය කිරීම්

වෙනත් මූල්‍ය වගකීම් ඉන් අනතුරුව ක්‍රමක්ෂය කරන ලද පිරිවැයට ගණනය කරයි. පොලී වියදම් හා විදේශ විනිමය හුවමාරු ලාභ සහ පාඩු ලාභාලාභ තුල හඳුනාගැනේ. හඳුනාගැනීම මත යම් ලාභයක් හෝ පාඩුවක් ද ලාභාලාභ තුල හඳුනාගැනේ. යම් මූල්‍ය වගකීමක ක්‍රමක්ෂය කරන ලද පිරිවැය යනු භායනය සඳහා යම් අඩු කිරීමක් සිදු කර ඵලදායී පොලී ක්‍රමවේදය භාවිත කරමින් සමුච්චිත ක්‍රමක්ෂය එකතු කර හෝ අඩු කර, ප්‍රධාන නැවත ගෙවීම් අඩු කර, මූලික හඳුනාගැනීමේදී මූල්‍ය වගකීම් ගණනය කරනු ලබන වටිනාකමයි.

හඳුනාගැනීමෙන් බැහැර කිරීම
සමාගමේ ගිවිසුම්ගත වගකීම්වලින් නිදහස් කරන විට, අවලංගු කරන විට හෝ කල් ඉකුත් වන විට සමාගම යම් මූල්‍ය වගකීමක් හඳුනාගැනීමෙන් බැහැර කරයි.

මූල්‍ය වත්කම් හා වගකීම් හිලව් කිරීම

මූල්‍ය වත්කම් හා වගකීම්වල අගයන් හිලව් කිරීමට සමාගම සතුව දැනට නෛතික වශයෙන් බලාත්මක කළ හැකි අයිතියක් වේ නම් හා දළ පදනමක් මත ඒවා නිරවුල් කිරීමට හෝ එම වත්කම අත්පත්කරගෙන ඊට සමගාමීව එම වගකීම නිරවුල් කිරීමට හෝ අපේක්ෂා කරන්නේ නම් පමණක් දළ වටිනාකම මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය තුල ඉදිරිපත් කෙරේ.

වත්කම් හා වගකීම්වල සාධාරණ අගය

සමාගම විසින් සාධාරණ අගය පිළිබඳ ධූරාවලිය අනුගමනය කරමින් සාධාරණ අගය ගණනය කරන අතර, එමගින් ගණනය කිරීම් සකස් කිරීමේදී භාවිත කරන යෙදවුම්හි සුවිශේෂීත්වය පිළිබිඹු කරයි.

1 මට්ටම: එක හා සමාන උපකරණ සඳහා සක්‍රීය වෙළඳපොලක් තුල නියම කරන ලද වෙළඳපොල මිලගණන් (සකස් නොකරන ලද) ඇති යෙදවුම්;

2 මට්ටම: සෘජුව (මිල ගණන් ලෙස) හෝ වක්‍රාකාර ලෙස (මිලගණන්වලින් ජනනය වන) නිරීක්ෂණය වන එම මට්ටම තුල ඇතුලත් නියම කරන ලද මිල ගණන් හැර වෙනත් මිල ගණන්වලට ඇති යෙදවුම්;

3 මට්ටම: නිරීක්ෂණය වන වෙළඳපොල දත්ත මත පදනම් නොවන වාර්තා කර ඇති සාධාරණ අගයන් මත සුවිශේෂී බලපෑමක් සිදු කරන යෙදවුම් භාවිත කරන තක්සේරුකරණ විධික්‍රම.

2.2.7 මුදල් හා මුදල් සමානයන්

අතැති මුදල් හා මුදල් සමානයන්, ඉල්ලුම් තැන්පතු හා අගයේ සුවිශේෂී වෙනස්කම් සිදුවීමේ අවදානමට යටත්ව දන්නා මුදල් අගයන්ට ඉතා ඉක්මණින් පරිවර්තනය කළ හැකි හා කෙටිකාලීන ඉහළ පෙලේ ද්‍රවශීලතාවයෙන් යුතු ආයෝජන මුදල් හා මුදල් සමානයන් ලෙස අර්ථගැන්වේ.

මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය සම්බන්ධයෙන්, අතැති මුදල් හා හිඟ බැංකු අයිරාවලින් බැහැර බැංකු තැන්පතුවලින් මුදල් හා මුදල් සමානයන් සමන්විත වේ.

2.2.8 ප්‍රතිපාදන සහ සංචිත වගකීම්

යම් වගකීමක් නිරවුල් කිරීමට අවශ්‍ය වන ආර්ථික ප්‍රතිලාභ රඟත් මූලාශ්‍ර රැසක් පිටතට ගලායාමක් සිදුවිය හැකි බව හා එම වගකීමේ අගය සඳහා විශ්වාසනීය ඇස්තමේන්තුවක් සකස් කළ හැකි බව පෙනී යන විට යම් අතීත සිදුවීමක ප්‍රතිඵලයක් හේතුවෙන් සමාගමට වර්තමානයේ වගකීමක් (නෛතික හෝ ව්‍යුහාත්මක) පවතින විටකදී ප්‍රතිපාදන හඳුනාගැනේ.

මුදල්වල කාලීන වටිනාකමේ බලපෑම වැදගත් වන්නේ නම්, යෝග්‍ය ස්ථානයන්හිදී වගකීමට සුවිශේෂී අවදානම් පිළිබිඹු කරන පූර්ව බදු අනුපාත ක්‍රමයක් භාවිත කරමින් ප්‍රතිපාදන සඳහා වට්ටම් ලබා දෙයි. වට්ටම් ලබාදීම භාවිත කිරීමේදී, කාලසීමා සාධකය හේතුවෙන් ප්‍රතිපාදනවල ඉහළ යාම මූල්‍ය පිරිවැයක් ලෙස හඳුනාගැනේ.

මූලාශ්‍ර පිටතට ගලායාම දුරස්ථ නොවන්නේ නම් පමණක් සියලුම සංචිත වගකීම් මූල්‍ය ප්‍රකාශවලට සටහනක් ලෙස අනාවරණය කරමින් ඇත.

2.3 මූල්‍ය අවදානම් කළමනාකරණ අපේක්ෂාවන් හා ප්‍රතිපත්ති

ව්‍යුත්පන්න හැර සමාගමේ ප්‍රධාන මූල්‍ය වගකීම් ණය සහ ණය පදනම මත ලබාගැනීම්, වෙළඳාම හා වෙනත් ගෙවිය යුතු අගයන්වලින් සමන්විත වේ. මෙම මූල්‍ය වගකීම්වල ප්‍රධාන අරමුණ වන්නේ සමාගමේ මෙහෙයුම් මූල්‍යකරණය කිරීමත්, එකී මෙහෙයුම්වලට සහාය ලබා දීම සඳහා සුරක්ෂිතභාවයක් ලබාදීමත් ය. සමාගම සතුව වෙනත් ලැබිය යුතු ආදායම් හා මුදල් සහ මෙහෙයුම් මගින් සෘජුවම ජනනය වන කෙටිකාලීන තැන්පතු ඇත. ඒ අනුව, එහි මූල්‍ය උපකරණ භාවිතයෙන් පැන නගින ණය අවදානම හා ද්‍රවශීලතා අවදානම සඳහා සමාගම නිරාවරණය වේ.

මෙම සටහන මගින් එකී එක් එක් අවදානම සඳහා සමාගමේ නිරාවරණය වීම, සමාගමේ අරමුණු, අවදානම් ගණනය කර කළමනාකරණය කිරීමේ ප්‍රතිපත්ති සහ ක්‍රියාවලීන් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.

2.3.1 ණය අවදානම

සිය ගිවිසුම්ගත වගකීම් සපුරාලීමට යම් පාරිභෝගිකයෙකු හෝ මූල්‍ය උපකරණයක සහෝදර පාර්ශ්වයක් අසමත් වන්නේ නම් සමාගමට ඇති වන මූල්‍ය පාඩුව පිළිබඳ අවදානම ණය අවදානම වන අතර, මූලිකවම පාරිභෝගිකයින්ගෙන් සමාගමට ලැබිය යුතු ආදායම් මගින් ජනනය වේ.

2.3.2 ද්‍රවශීලතා අවදානම

මුදල් හෝ වෙනත් මූල්‍ය වත්කමක් ලබාදීම මගින් නිරවුල් කරනු ලබන මූල්‍ය වගකීම් හා බැඳි වගකීම් සපුරාලීමේදී සමාගම විසින් මුහුණදෙනු ලබන අවදානම ද්‍රවශීලතා අවදානමයි. ද්‍රවශීලතාව කළමනාකරණය කිරීමට සමාගම සතු ප්‍රවේශය වන්නේ පිළිගත නොහැකි පාඩු හෝ සමාගමේ කීර්තිනාමයට හානි කිරීමකින් තොරව සාමාන්‍ය හා පීඩනකාරී තත්ත්ව දෙකම යටතේ කල් පිරෙන විටදී සිය වගකීම් සපුරාලීමට සමාගම සතුව යම් අවස්ථාවකදී ප්‍රමාණවත් ද්‍රවශීලතාවක් හැකිතාක් දුරට පවතින බව තහවුරු කරගැනීමය.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස දාහතරක කාලසීමාව සඳහා

		Rs. Cts.
(3)	**ආදායම**	
	පර්යේෂණවලින් ලද ආදායම	-
		-
(4)	**වෙනත් මෙහෙයුම් ආදායම්**	
	අයදුම්කිරීමේ ගාස්තු	240,000.00
		240,000.00
(5)	**මෙහෙයුම් ලාභය**	
	පහත ඒවා ඇතුළු සියළු වියදම් අයකරගැනීමෙන් පසු මෙහෙයුම් ලාභය/ (පාඩුව) ප්‍රකාශකර ඇත.	
	වැටුප් හා වේතන	17,624,586.52
	සේවක අර්ථසාධක අරමුදලට දායකවීම	2,098,348.03
	සේවක භාරකාර අරමුදලට දායකවීම	524,587.01
	ගොඩනැගිලි කුලිය	23,676,200.00
	ක්ෂයවීම	313,825.95
	වෙනත් මෙහෙයුම් වියදම්	6,219,753.85
		50,457,301.36
(6)	**මූල්‍ය වියදම්**	
	බැංකු අයකිරීම්	5,469.99
		5,469.99
(7)	**බදුකරණය**	
	ආදායම් බදු පිරිවැය	
	බදුවලට පෙර ලාභය /(පාඩුව)	(50,222,771.35)
අඩු කළා	ආයෝජන ආදායම් ලෙස සලකන ලද ප්‍රමාණයන්	-
එකතු තළා	අනුදත් නොවන වියදම්	144,612.00
අඩු කළා	ප්‍රාග්ධන දීමනා	(1,171,273.00)
	ආයෝජන ආදායම	-
	බදු අයකළ හැකි ආදායම	(51,249,432.35)
	14% ආදායම බදු අනුපාතය ආදේශ කිරීම	-

මූල්‍ය තත්ත්වය සඳහා සටහන්
2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස දාහතරක කාලසීමාව සඳහා

		Rs. Cts.	Rs. Cts.	Rs. Cts.	Rs. Cts.
(8)	**දේපළ, පිරියත හා උපකරණ**				
(8.1)	**දළ රැගෙන ආ මුදල**				
	පිරිවැය	*ආරම්භක ශේෂය*	*එකතු කිරීම්*	*ඉවත් කිරීම්*	*2021.12.31 දිනට ශේෂය*
	පරිඝණක හා ආශ්‍රිත උපකරණ	-	5,856,367.04	-	5,856,367.04
		-	5,856,367.04	-	5,856,367.04
(8.2)	**ක්ෂයවීම්**				
	පිරිවැය	*ආරම්භක ශේෂය*	*වසර සඳහා අයකිරීම*	*ඉවත් කිරීම්/ හුවමාරු කිරීම්*	*2021.12.31 දිනට ශේෂය*
	පරිඝණක හා ආශ්‍රිත උපකරණ	-	313,825.95	-	313,825.95
		-	313,825.95	-	313,825.95
(8.3)	**ගිණුම්පොත්වල සඳහන් ශුද්ධ අගය**				
	පිරිවැය				
	දේපළ, පිරියත හා උපකරණවල මුළු රැගෙන ආ මුදල				
		-			**5,542,541.09**
(9)	**ක්‍රියාත්මක ප්‍රාග්ධන කාර්යයන්**				
	පිරිවැය	*ආරම්භක ශේෂය*	*එකතු කිරීම්*	*ඉවත් කිරීම්*	*2021.12.31 දිනට ශේෂය*
	ඉඩම් සංවර්ධන පිරිවැය	-	44,500.00	-	44,500.00
		-	44,500.00	-	**44,500.00**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස දාහතරක කාලසීමාව සඳහා

		රු ශත.
(10)	ලැබිය යුතු හා ගෙවන ලද අත්තිකාරම්	
	ජල සැපයුම සඳහා අත්තිකාරම	24,035,653.52
	බල සැපයුම සඳහා අත්තිකාරම (විදුලිබලය)	17,975,600.00
	පෙර ගෙවන ලද ගොඩනැගිලි කුලිය	11,838,100.00
	ලාංඡන සඳහා අත්තිකාරම	165,000.00
	වෙනත් අත්තිකාරම්	5,000.00
		54,019,353.52
(11)	මුදල් හා මුදල් සමානයන්	
	බැංකු ගිණුම-මහජන බැංකුව	4,650,139.84
	අතැති මුදල	36,615.65
		4,686,755.49
(12)	ප්‍රකාශිත ප්‍රාග්ධනය	
	කොටස 01	10.00
		10.00
(13)	වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ	
	JKOA වෙත ගෙවීය යුතු	546,000.00
	ගිණුම්කරණ හා බදු සේවා	60,000.00
	ගෙවිය යුතු ලේකම්කරණ ගාස්තු	195,000.00
	SLINTEC වෙත ගෙවිය යුතු උපයෝගිතා වියදම්	184,401.00
	ගෙවිය යුතු මුද්දර ගාස්තු	2,825.00
	ගෙවිය යුතු වෙනත් දෑ	27,695.45
		1,015,921.45

(14) වෙනත් ආශ්‍රිත පාර්ශව අතර හුවමාරු

(අ) සමාගමෙහි ප්‍රධාන කළමණාකරණ පිරිස් සමග හුවමාරු

ප්‍රධාන කළමණාකරණ පිරිස් සමන්විත වන්නේ සමාගමෙහි අධ්‍යක්ෂවරුන්ගෙන වන අතර ඔවුන් සමඟ සිදුවූ හුවමාරු පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

(i) ප්‍රධාන කළමණාකරණ පිරිස් වෙත ණය මුදල්

සමාගමෙහි ප්‍රධාන කළමණාකරණ පිරිස් වෙත ණය මුදල් ලබා දී නොමැත.

(ii) ප්‍රධාන කළමණාකරණ පිරිස් වෙතින් ණය මුදල්

සමාගමෙහි ප්‍රධාන කළමණාකරණ පිරිස් වෙතින් ණය මුදල් ලබා ගෙන නොමැත.

(15) බැඳීම්

(i) ප්‍රාග්ධන බැඳීම්

2021 දෙසැම්බර් 31 වන දිනට, ගැළපීම් අවශ්‍ය වන හෝ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කළ යුතු ප්‍රාග්ධන පිරිවැය බැඳීම් නොමැත.

(ii) මූල්‍ය බැඳීම්

2021 දෙසැම්බර් 31 වන දිනට, ගැළපීම් අවශ්‍ය වන හෝ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කළ යුතු මූල්‍ය බැඳීම් නොමැත.

(16) අවිනිශ්චිතතා

2021 දෙසැම්බර් 31 වන දිනට, ගැළපීම් අවශ්‍ය වන හෝ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කළ යුතු අවිනිශ්චිත වගකීම් නොමැත.

(17) වාර්තා කරන කාලච්ඡේදයට පසුව සිදු වූ සිදුවීම්

2021 දෙසැම්බර් 31 වන දිනට, ගැළපීම් අවශ්‍ය වන හෝ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කළ යුතු, වාර්තා කිරීමේ දිනයට පසුව සිදු වූ භෞතික සිදුවීම් නොමැත..

විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස දාහතරක කාලසීමාව සඳහා

	සටහන්	රු ශත.
ආදායම		-
සෘජු පිරිවැය	**(A)**	(23,002,061.84)
දළ ලාභය		(23,002,061.84)
වෙනත් මෙහෙයුම් ආදායම්		240,000.00
පරිපාලන වියදම්	**(B)**	(27,455,239.51)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් සිදුවූ පාඩුව		(50,217,301.36)
මූල්‍ය වියදම	**(C)**	(5,469.99)
බදුකරණයට පෙර ශුද්ධ පාඩුව		**(50,222,771.35)**
බදුකරණය		-
කාලසීමාව සඳහා පාඩුව		**(50,222,771.35)**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස දාහතරක කාලසීමාව සඳහා

		රු. ශත.
(අ)	**සෘජු වියදම්**	
	පර්යේෂක කාර්ය මණ්ඩල වැටුප්	8,525,690.47
	සේ. අ. අ. වියදම් - පර්යේෂණ කාර්ය මණ්ඩලය	1,023,082.86
	සේ. භා. අ. වියදම් - පර්යේෂණ කාර්ය මණ්ඩලය	255,770.71
	නිර්වේතනික ගෙවීම්	650,000.00
	ගොඩනැගිලි කුලිය - සෘජු	12,311,624.00
	ක්ෂයවීම්- පරිඝණක හා ආශ්‍රිත උපකරණ (පර්යේෂණ)	144,612.00
	පර්යේෂණ පරිභෝජ්‍ය මිලදී ගැනීම්	84,005.80
	අයදුම්පත් සැකසුම් ගාස්තු - 2.99%	7,276.00
		23,002,061.84
(ආ)	**පරිපාලන වියදම්**	
	පරිපාලන කාර්ය මණ්ඩල වැටුප්	9,098,896.05
	සේ. අ. අ. වියදම් - පරිපාලන කාර්ය මණ්ඩලය	1,075,265.17
	සේ. භා. අ. වියදම් - පරිපාලන කාර්ය මණ්ඩලය	268,816.30
	මූ.පා. ප (IEE) වාර්තා වියදම්	2,610,780.00
	ගිණුම්කරණ හා බදු සේවා	60,000.00
	ලේකම්කරණ ගාස්තු	197,203.20
	ප්‍රචාරණ වියදම්	461,055.00
	වෙනත් මෙහෙයුම් පිරිවැය	453,459.23
	මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය	537,863.70
	රථවාහන රක්ෂණ හා ලියාපදිංචිය	95,062.30
	සන්නිවේදන අයකිරීම්	127,108.02
	රථවාහන අලුත්වැඩියාව හා නඩත්තුව	481,989.41
	නීතිමය ගෙවීම්	34,592.00
	උපයෝගිතා වියදම්	184,401.00
	ඉන්ධන හා ගමනාගමන වියදම්	234,958.19
	ක්ෂයවීම් - පරිඝණක හා ආශ්‍රිත උපකරණ (පරිපාලන)	169,213.95
	ගොඩනැගිලි කුලිය - පරිපාලන	11,364,576.00
		27,455,239.51
(ඇ)	**මූල්‍ය වියදම්**	
	බැංකු අයකිරීම්	5,469.99
		5,469.99